# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 63 — 1973 ජුනි 08 වැනි සිකුරාදා — 1973.06.08

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස: (II ආ) වැනි ඡේදය — පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)



| | පිට | | පිට |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 685 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... — | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | රට බිම් විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... — | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 693 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... — | — |
| කොටුපල් වෙන්ද හා වෙනත් වෙන්ද විකිණීම ... ... | — | විවිධ දැන්වීම් ... ... — | 698 |



## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

### මහවැලි සංවර්ධන මණ්ඩලය—බෝවතැන්න

### වැඩබිම්වල අර්ධ ස්ථිර නිවාස තැනීම සඳහා ටෙන්ඩර්

නාඋල බෝවතැන්න හැරවීම් යෝජනා ක්‍රමයේ වැඩබිම්වල අර්ධ ස්ථිර නිවාස තැනීම සඳහා ටෙන්ඩර් පත් මෙයින් කැඳවනු ලැබේ.

මේ හා සමාන වැඩ සම්බන්ධයෙන් පළපුරුද්දක් ඇති රජයේ දෙපාර්තමේන්තුවක, මණ්ඩලයක හෝ සංස්ථාවක රු. 25,000 හෝ වැඩි ගණනකට ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙත්.

ටෙන්ඩර් පත්‍ර 1973.06.20 දින දක්වා රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවීමෙන්, නාඋල මහවැලි සංවර්ධන මණ්ඩලයේ, බෝවතැන්න ප්‍රධාන ව්‍යාපාර ඉංජිනේරු තැනගෙන් කාර්යාල වේලාවන් තුළ දී ලබා ගත හැක.

ටෙන්ඩර්පත් භාරගැනීම 1973.06.22 දින පෙ. ව. 11.00 ට අවසන් වනු ඇත.

මේ සම්බන්ධයෙන් වැඩිමනත් විස්තර නාඋල, මහවැලි සංවර්ධන මණ්ඩලයේ බෝවතැන්න ප්‍රධාන ව්‍යාපාර ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැක.

පී. සිවසුබ්‍රමනියම්,
ප්‍රධාන ව්‍යාපාර ඉංජිනේරු—බෝවතැන්න.

නාඋල,
මහවැලි සංවර්ධන මණ්ඩලය.

6–240—73.06.08 දින අංක 63 දරණ ගැසට් පත්‍රය

---

### ටෙන්ඩර් දැන්වීම—මොණරාගල කච්චේරිය

මොණරාගල දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩ සඳහා 73.07.05 වැනි දින පෙ.ව. 10 දක්වා මුද්‍රා තබන ලද ටෙන්ඩර් මොණරාගල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත විසින් භාර ගනු ලැබේ.

(1) "මොණරාගල කච්චේරි නිවාස අළුත්වැඩියා කිරීම."

2. මොණරාගල ආණ්ඩුවේ ඒජන්තගෙන් 73.06.16 වැනි දින සිට 73.06.30 වැනි දින දක්වා ලබාගත හැකි ටෙන්ඩර් පත්වල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු ය.

3. රජයේ දෙපාර්තමේන්තුවල ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට හා ග්‍රාම සංවර්ධන සමිති, සමුපකාර සමිති වැනි අනුමැතිය ලත් සමිතිවලට පමණක් ටෙන්ඩර් කිරීමට අවකාශ ඇත. රු. 25ක් ටෙන්ඩර් තැන්පත් වශයෙන් ඕනෑම කච්චේරියක ලංකා බැංකු ශාඛාවේ තැන්පත් කර කුවිතාන්සි ඉදිරිපත් කරන අයට පමණක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති හා සමුපකාර සමිති වැනි අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලින් නිදහස් ය.

---

**සැලකිය යුතුයි**

**ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දහවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.**

**එල්. ඩබ්ලිව්. ඩී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

**1972 දෙසැම්බර් මස 15 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**කොළඹ.**

4. ලියුම් කවරයේ වම් පැත්තේ ඉහළ කෙළවර "මොණරාගල කච්චේරි නිවාස අළුත්වැඩියා කිරීම" යනුවෙන් සඳහන් කර ටෙන්ඩර් පත් 1973.07.05 වැනි දින පෙ.ව. 10 ට අපර ලේඛනගත තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් මෙම කච්චේරියේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතු ය. මෙදින නියමිත වෙලාවට පසු ලැබෙන ටෙන්ඩර් පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

5. 1973.07.05 වැනි දින පෙ.ව. 10:05ට ටෙන්ඩර් පත් විවෘත කරනු ලබන විට ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටීමට ඉඩ දෙනු ලැබේ. තෝරාගනු ලබන ටෙන්ඩර්කරු විසින් කොන්ත්‍රාත්තුවේ මුදලින් සියයට පහක (5%) ඇප මුදලක් තැන්පත් කිරීමෙන් පසු ගිවිසුම් අත්සන් කළ යුතු ය. තෝරාගනු ලබන ටෙන්ඩර් කරුට ඒ බැව් දන්වා දින 7 ක් ඇතුලත ඇප මුදල තැන්පත් කර ගිවිසුම් අත්සන් නො කළහොත්, ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජ සන්තක වේ.

6. නිම කරන ලද වැඩ ප්‍රමාණයෙන් සියයට අනූවක් (90%) සඳහා පමණක් මුදල් ගෙවා ඉතිරි මුදල හා ඇප මුදල මාස 3 ක් ඉක්ම ගිය පසු ගෙවනු ඇත.

7. වැඩි විස්තර කාර්යාල වේලාවන් හි මෙම කච්චේරියෙන් (ග්‍රාම පාලන අංශය) ලබා ගත හැකි ය.

ස. ජ. සුමණසේකර බණ්ඩා,
මොණරාගල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

දිසාපති කාර්යාලය,
මොණරාගල,
1973 මැයි මස 18 වැනි දින.

6–180—73.06.08 දින අංක 63 දරණ ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

කොළඹ වරාය කොමිෂන් සභා ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1973 ජූනි මස 27 වෙනි දින පස්වරු 2.30 දක්වා කොළඹ වරාය කොමිෂන් සභාවේ විදුලි අංශයේ ඇති පාවිච්චි කළ නොහැකි බැටරි 187 ක් විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. 1973 ජූනි මස 27 වෙනි දින පස්වරු 2.30 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් ටෙන්ඩර් භාරගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියාට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාරදී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබාගත යුතුය. නැතහොත් ටෙන්ඩර්කරුවන්ට තමන්ගේ ටෙන්ඩර් දෙපාර්තමේන්තු ටෙන්ඩර් පෙට්ටියෙහි පුද්ගලිකව තැන්පත් කළ හැක.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛණ කොළඹ වරාය කොමිෂන් සභා කාර්යාලයේදී පරීක්ෂා කළ හැක. රු. 100 මුදලක් වරාය කොමිෂන් සභා කාර්යාලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම කොළ ලබාගත හැක. ටෙන්ඩර් කොන්දේසිවලට අනුව ඇති මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබාගත් පෝර්ම කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1973 ජූනි මස 25 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

එස්. එම්. බී. දොලපිහිල්ල,
වරාය කොමසාරිස්.

කොළඹ වරාය කොමිෂන් සභාව,
කොළඹ 1.
1973. 06. 08.

6–282—73.06.08 දින අංක 63 දරණ ගැසට් පත්‍රය

---

## හිස් සාමාන්‍ය තාර පීප්ප, හිස් වානේ තාර පීප්ප සහ හිස් සිමෙන්ති උර විකිණීම හා ඉවත් කිරීම සඳහා ටෙන්ඩර් කැඳවීමයි

වාරිමාර්ග, විදුලි බල හා මහා මාර්ග අමාත්‍යාංශයේ වයඹ දිසාවේ ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සේවා සංවිධානයේ කුරුණෑගල වැඩ අධ්‍යක්ෂ කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් පහත සඳහන් ද්‍රව්‍ය මිලට ගෙන ඉවත්කර ගැනීම සඳහා ලාංකිකයන් ගෙන් සහ ලාංකික ආයතනවලින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

(1) හිස් සාමාන්‍ය තාර පීප්ප.
(2) හිස් වානේ තාර පීප්ප.
(3) හිස් සිමෙන්ති කඩදාසි උර.

2. ටෙන්ඩර් පත් භාරගැනීම අවසාන වනුයේ 1973 ජූනි මස 22 වැනි දින පෙරවරු 10.00 ට වේ. රුපියල් 100 ක මුදල් තැන්පත් කොට ලබාගත් ලදුපත් ඉදිරිපත් කිරීමෙන් පසු 1973 ජූනි මස 21 වැනි දින ප. ව. 3.30 වන තෙක් ටෙන්ඩර් පෝර්ම ලබා ගත හැක. 1973 ජූනි 22 වැනි දින පෙ. ව. 10.30 ට ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ.

3. කොන්ත්‍රාත්තුව 1973 ජුලි මස 01 සිට 1973 දෙසැම්බර් 31 දක්වා වූ මාස 06 කාලයකට සීමා වේ.

4. වැඩිදුර විස්තර හා දීර්ඝ ටෙන්ඩර් දැන්වීම් පත්‍ර, කුරුණෑගල දිසා වැඩ අධ්‍යක්ෂ වයඹ දිසා කාර්යාලයෙන් ලබා ගත හැක.

ඩී. වී. ඒ. සේනාරත්න,
වැඩ අධ්‍යක්ෂ—වයඹ දිසාව.

1973 මැයි මස 25 වැනි දින,
කුරුණෑගල, වයඹ දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලයේ දී ය.

6–230—73.06.08 දින අංක 63 දරණ ගැසට් පත්‍රය

---

## ටෙන්ඩර් දැන්වීම

### පුස්සැල්ලාව විශේෂ කොමසාරිස් කාර්යාලය

පුස්සැල්ලාව සුළු නගර සභාවේ කාර්යාල ගොඩනැගිල්ල තැනීමේ කර්මාන්තය සඳහා රජයේ දෙපාර්තමේන්තුවක රුපියල් 50,000 කට නොඅඩු මුදලකට ලියා පදිංචිවී ඇති කොන්ත්‍රාත් කරුවන් විසින් එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් ඉල්ලුම් පත් 1973 ජූනි මස 20 වැනි දින පෙරවරු 10 දක්වා මා විසින් භාරගනු ලැබේ.

ටෙන්ඩර් ඉල්ලුම් පත් පිළියෙල කළ යුත්තේ රුපියල් 500 ක ටෙන්ඩර් ඇප මුදලක් හා රුපියල් 50 ක ටෙන්ඩර් පෝර්ම ගාස්තුවක් ගෙවූ විට, මෙම කාර්යාලයෙන් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍ර වලය. ටෙන්ඩර් ඉල්ලුම් පත් ලබාගැනීමේදී කොන්ත්‍රාත් කරුවකු වශයෙන් ලියාපදිංචිවී ඇති බවට සහතික ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලබන්නේ 1973 ජූනි මස 19 වැනි දින පස්වරු 2 දක්වා පමණි.

ටෙන්ඩර් ඉල්ලුම් පත්, පිටපත් දෙකකින් පිළියෙල කොට 'විශේෂ කොමසාරිස්, විශේෂ කොමසාරිස් කාර්යාලය, පුස්සැල්ලාව' යන ලිපිනයට ලියා පදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. නැතහොත් ඒ සඳහා මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය හැක. ටෙන්ඩර් ඉල්ලුම් පත් බහාලන කවරයේ වම් පස උඩ කෙළවරේ 'පුස්සැල්ලාව සුළු නගර සභා කාර්යාල ගොඩනැගිල්ල තැනීමේ කර්මාන්තය සඳහා ටෙන්ඩරය' යනුයෙන් සඳහන් කළ යුතුය.

මේ පිළිබඳව අවශ්‍ය වැඩි විස්තර, කාර්යාල වේලාවන් තුලදී, මෙම කාර්යාලයට පැමිණ ලබාගතහැක.

එල්. ජී. බී. පෙරේරා,
විශේෂ කොමසාරිස්—පුස්සැල්ලාව නගරය.

1973 මැයි මස 10 වැනි දින,
පුස්සැල්ලාව විශේෂ කොමසාරිස් කාර්යාලයේදීය.

6–273—73.06.08 දින අංක 63 දරණ ගැසට් පත්‍රය

---

## කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

### කොළඹ ලක්සලින් බඩු ප්‍රවාහනය කිරීම සඳහා ටෙන්ඩර් කැඳවීම

කොළඹ, හේමාස් ගොඩනැගිල්ලේ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් කොළඹ ලක්සලෙහි සිට කොළඹ මහ නගර සභා සීමාව තුල පිහිටි ස්ථාන යන්ට හා වේයන්ගොඩ, දිවුලපිටිය, ජාඇල හා පන්නිපිටිය යන සමුපකාර සමිතිවලට බඩු ප්‍රවාහණය කිරීම සඳහා 1973.6.28 දින පෙ. ව. 10 වන තුරු ටෙන්ඩර් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආකෘතිය අනුව ටෙන්ඩර් පත් සකස් කළ යුතුයි.

කොළඹ මහ නගර සභා සීමාව තුල

(අ) පැය 8 ක දිනයකට එක් ලොරියකට අය කළ හැකි ප්‍රමාණය
රු. :————

(ආ) පැය 4 ක දිනකට එක ලොරියකට අය කළ හැකි ප්‍රමාණය
රු. :————

(ඇ) ධාවන සැතපුමකට අය කළ හැකි ප්‍රමාණය රු. :————

(ඈ) රඳවා තැබීමේ කුලිය රු. :————.

(ඉ) ලොරියේ බර :————

**සමූපකාර සමිති**

(අ) ධාවන සැතපුමකට අය කළ හැකි ප්‍රමාණය රු. :————

(ආ) හිස් ලොරිය ආපසු එන්නේ නම් ආපසු ඒමේදී සැතපුම කට අය කළ හැකි ප්‍රමාණය රු. :————

(ඇ) රඳවා තැබීමේ කුලිය රු. :————

(ඈ) ලොරියේ බර :————

2. සියලුම ටෙන්ඩර් පත් කොළඹ, බ්‍රිස්ටල් වීදියේ, හේමාස් ගොඩනැගිල්ලේ, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත 1973.6.28 දින පෙ. ව. 10 පෙර ලැබෙන්න සැලැස්විය යුතුයි. ටෙන්ඩර් පත් බහා ලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "කොළඹ ලක්සලින් බඩු ප්‍රවාහණය කිරීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කළ යුතුයි.

3. 1973.6.28 දින පෙ. ව. 10 ට පසු ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර් කරුවන්ට එහි පැමිණීමට අවසර දෙනු ඇත.

සෝමපාල ගුණධීර,
කුඩා කාර්මාන්ත අධ්‍යක්‍ෂ.

යොමු අංකය : 3/1—(5/49),
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල, කොළඹ 1.
දිනය : 1973.5.29.

6–284—73.06.08 දින අංක 63 දරණ ගැසට් පත්‍රය

---

**ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව**

ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ලී පිටපලු කෑලි ටොන් 30 ක් මිළ දී ගෙන ඉවත් කිරීම සඳහා එවනු ලබන ටෙන්ඩර් පත්‍ර දුම්රිය මූලස්ථාන ටෙන්ඩර් මංඩලයේ සභාපති විසින් (ලිපිනය : දු. සා. කාර්යාලය-තැ. පෙ. 355, ඕල්කට් මාවත, කොළඹ 10) 1973 ජූලි මස 4 දින පෙ. ව. 11 වන තෙක් බාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමට පෙර, අවශ්‍ය වුවහොත් ටෙන්ඩර් කරුවන් විසින් ඉහත සඳහන් සේවාව බාර ගැනීමට සහ සතුටුදායක ලෙස ඉටු කිරීමට තමාගේ මුදල් තත්වය ප්‍රමාණවත් බව ඔප්පු කිරීම සඳහා ආධාරවන ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

3. මර්දාන දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැකි ෆෝරම කොළවල ටෙන්ඩරය ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුය.

4. ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 100 (සියයක්) මර්දාන දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී තැනගේ කාර්යාලයේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1973 ජූනි මස 30 දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

5. 1973 ජූලි මස 4 වැනි බදාදා පෙ. ව. 11.05 දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට තටන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

6. වැඩි විස්තර දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් ලබා ගත හැකිය.

ඇම්. සරින්,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

1973.5.15 දින,
කොළඹ.

6–184—73.06.08 දින අංක 63 දරණ ගැසට් පත්‍රය

---

**ටෙන්ඩර් තීරණ—පොලිස් දෙපාර්තමේන්තුව**

දම්වැල් සහිත නලා 6,000 ක් සහ ඉණපටි ගාංචු 5,000 ක් සැපයීම —ටෙන්ඩර් විවෘත කළ දිනය 1973. 03. 30.

1973. 03. 09 දින නිකුත් වූ රජයේ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශ කරන ලද ඉහත සඳහන් භාණ්ඩ වලින් දම්වැල් සහිත නලා 6,000 ක් සම්බන්ධයෙන් ටෙන්ඩර්කරුවන් 5 දෙනෙකු විසින් ගණන් 5 ක් ඉදිරිපත් කරන ලදී. තෝරා ගත් ටෙන්ඩර්කරු පිළිබඳ විස්තර පහත දැක්වේ :—

එම්. එම්. අන්සාර් මොහිඩීන්,
2, ඔබර්ත් සයිඩ්,
දෙහිවල.

බාරගත් මිළ ගණන එක් දම්වැල් සහිත නලාවකට රු. 13.25 යි.

ඉණ පටි ගාංචු 5,000 ක් සම්බන්ධයෙන් කිසිවෙකුගේත් ටෙන්ඩර් බාර නොගන්නා ලදී.

ජී. පුංචිමහත්මයා,
පොලිස්පති වෙනුවට.

1973 මැයි මස 26 වැනි දින,
කොළඹ 1,
පොලිස් මූලස්ථානයේ දීය.

6–302/1–73.06.08 දින අංක 63 දරණ ගැසට් පත්‍රය

---

**ටෙන්ඩර් තීරණ—පොලිස් දෙපාර්තමේන්තුව**

බෙරේ තොප්පි 1,000 ක් සැපයීම—ටෙන්ඩර් විවෘත කළ දිනය— 1973. 03. 30.

1973. 03. 09 දින නිකුත් වූ රජයේ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශ කරන ලද ඉහත සඳහන් සැපයීම පිළිබඳ ටෙන්ඩරය අවලංගු කර ඇත.

පොලිස් මූලස්ථානය,
කොළඹ 1,
1973 මැයි මස 26 වැනි දින.

ජී. පුංචිමහත්මයා,
පොලිස්පති වෙනුවට.

6–302/2–73.06.08 දින අංක 63 දරණ ගැසට් පත්‍රය

---

**පොලිස් දෙපාර්තමේන්තුවට මැෂින් තුවක්කු බැකට්ස් 2,000 ක් සැපයීම**

ප්‍රාදේශිකව ලබාගතහැකි මූල ද්‍රව්‍යවලින් සාදන ලද මැෂින් තුවක්කු බැකට්ස් 2,000 ක් සැපයීම සඳහා 1973. 6. 29 දින පෙ. ව. 10 දක්වා කොළඹ 1, තැ. පෙ. 517, පොලිස් මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ඉහත සඳහන් වේලාවට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී එතැනට පැමිණ සිටීමට ටෙන්ඩර් කරුවනට අවසර දෙනු ලැබේ.

3. පොලිස් මූලස්ථානයේ පොලිස්පතිගෙන් ලබාගන්නා ලද ටෙන්ඩර් ආකෘති පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පිළියෙළ කළ යුතුය. අවශ්‍ය බැකට් සාම්පල සාමාන්‍ය වැඩ කරන වේලාවන්හිදී පොලිස් මූලස්ථානයේදී පරීක්ෂා කර බැලිය හැකිය.

4. ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 200 ක් තැන්පත් කොට ඒ බවට ලබාගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් 1973. 6. 28 දින දවල් 12 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගත හැකිය. තැන්පත් මුදල් පොලිස් මූලස්ථානයේ හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක තැන්පත් කළ හැකිය.

5. සැම්පලයක් ඉදිරිපත් කළ යුතු ය. මෙය ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනයට පෙර ටෙන්ඩර්කරුගේ නම සඳහන් ලේබලයක් සමඟ පොලිස් මූලස්ථානයේ තැන්පත් කළ යුතුය.

6. වැඩි විස්තර පොලිස් මූලස්ථානයෙන් දැනගත හැකි ය.

ජී. පුංචිමහත්මයා,
පොලිස්පති වෙනුවට.

1973 මැයි මස 21 වැනි දින,
කොළඹ 1,
පොලිස් මූලස්ථානයේ දීය.

6–291—73.06.08 දින අංක 63 දරණ ගැසට් පත්‍රය

**ටෙන්ඩර් තීරණ—පොලිස් දෙපාර්තමේන්තුව**

සව්ඨන තොප්පි 500 ක් සැපයීම—ටෙන්ඩර් විවෘත කළ දිනය—1973. 4. 3.

1973. 3. 9 දින නිකුත්වූ රජයේ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශ කරන ලද ඉහත සඳහන් සැපයීම පිළිබඳ ටෙන්ඩරය සම්බන්ධයෙන් ටෙන්ඩර්කරුවන් 2 දෙනෙකු විසින් මිල ගණන් 2 ක් ඉදිරිපත් කරන ලදි. තෝරා ගත් ටෙන්ඩර්කරු පිළිබඳ විස්තර පහත දැක්වේ

ආම් ඇන්ඩ් නේවි ස්ටෝර්ස්,
27, රෝහල් වීදිය,
කොළඹ 1.

බාරගත් මිල ගණන—එක් සව්ඨන තොප්පියකට රු. 114.00.

ජී. දුංවිමහත්මයා,
පොලිස්පති වෙනුවට.

පොලිස් මූලස්ථානය,
කොළඹ 1,
1973 මැයි මස 26 වැනි දින.

6–292—73.06.08 දින අංක 63 දරන ගැසට් පත්‍රය

---

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

කොළඹ 5, නාරාහේන්පිට, නාවලපාරේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැඩපල හා යන්ත්‍රාගාරයේ කෘෂිකර්ම ඉංජිනේරු තැන විසින් පහත සඳහන් ද්‍රව්‍යයන් කොළඹ 5 නාරාහේන්පිට වැඩපල හා යන්ත්‍රාගාරයට ගෙනවිත් භාරදීම සඳහා 1973 ජූනි මස 25 දින සවස 3 දක්වා ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

**ඇසටෙලීන් බෝතල් 5. (තිස්)**

**ප්‍රමිත :**

දිය කරන ලද ඇසටෙලීන් පිරවීම සඳහා පාස්සපු බෝතල් අවශ්‍යය. වර්ග අඟලකට රාත්තල් 200 ක පමණ වායු පීඩනයක් ඉසිලීමට ශක්තියක් ද, අඩු වශයෙන් වායු ඝන අඩි 100 ක් පිරවීමට ඉඩ කඩ ද තිබිය යුතුය. දිග අඟල් 36 ක් පමණ විය යුතුය. ප්‍රවේසම් සහිත මූඩි සහ වැල්ව් වලින් සම්පූර්ණ විය යුතුය. මෙම බෝතල් පිළිගත් ප්‍රමිතයන්ට සෑම අතින්ම සම්පූර්ණයෙන් සම්මත විය යුතුය.

2. ටෙන්ඩර් පත් මුද්‍රා තැබූ කවරවල එවිය යුතු අතර, කවරයේ වම් උඩ කෙළවරේ "ඇසටෙලීන් තිස් බෝතල්" යන්න සඳහන් කර නියමිත වේලාවට පෙර කොළඹ 5, නාරාහේන්පිට, නාවලපාරේ පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැඩපල හා යන්ත්‍රාගාරයේ කෘෂිකර්ම ඉංජිනේරු (සැපයීම්) වෙත එවිය යුතුය.

3. ප්‍රශ්න කිරීමකින් තොරව ටෙන්ඩර් පත් පිළිගැනීම හෝ කොටසක් පිළිගැනීම හෝ පිළි නොගැනීමේ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත ඇත.

4. ටෙන්ඩර් පත් දෙ පිටපතකින් යුතුව එවිය යුතුය.

ජේ. කේ. පී. ප්‍රනාන්දු,
කෘෂිකර්ම ඉංජිනේරු (නිෂ්පාදන).

වැඩපල හා යන්ත්‍රාගාරය,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1728. කොළඹ 5,
1973. 05. 28.

6–276—73.06.08 දින අංක 63 දරන ගැසට් පත්‍රය

---

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

කොළඹ 5, නාරාහේන්පිට නාවලපාරේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැඩපල හා යන්ත්‍රාගාරයේ කෘෂිකර්ම ඉංජිනේරු තැන විසින් පහත සඳහන් ද්‍රව්‍ය කොළඹ 5, නාරාහේන්පිට වැඩපල හා යන්ත්‍රාගාරයට ගෙනවිත් භාර දීම සඳහා 1973 ජූනි 25 දින සවස 3 දක්වා ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

**ඔක්සිජන් වායුව පිරවීම සඳහා තිස් බෝතල් 6 (හයයි)**

**ප්‍රමිත :**

පැස්සුම් සඳහා භාවිතා කරණ වානිජ ඔක්සිජන් වායු පිරවීම සඳහා මැන්ගනීස් වානේ ලෝහයෙන් සාදන ලද බෝතල් වර්ග අඟලකට රාත්තල් 2,000 ක වායු පීඩනයක් ඉසිලීමට ශක්තියක් ද අඩු වශයෙන් වායු ඝන අඩි 200 පිරවීමට ඉඩ කඩද තිබිය යුතුය. දිග අඟල් 50 ක් පමණ විය යුතුය. ප්‍රවේසම් සහිත මූඩි සහ වැල්ව් වලින් සම්පූර්ණ විය යුතුය. මෙම බෝතල් පිළිගත් ප්‍රමිතයන්ට සෑම අතින්ම සම්පූර්ණ විය යුතුය.

ඉහත ප්‍රමිතයන්ගෙන් යම් වෙනස්වීම් ඇතොත් එය ටෙන්ඩර් පතෙහි සඳහන් කළ යුතුය.

2. ටෙන්ඩර් පත් මුද්‍රා තැබූ කවරවල එවිය යුතු අතර, කවරයේ උඩ වම් කෙළවරේ "ඔක්සිජන් වායු පිරවීම සඳහා බෝතල්" යන්න සඳහන් කර නියමිත වේලාවට පෙර කොළඹ 5, නාරාහේන්පිට නාවල පාරේ, පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැඩපල හා යන්ත්‍රාගාරයේ කෘෂිකර්ම ඉංජිනේරු (සැපයීම්) වෙත එවිය යුතුය.

3. ප්‍රශ්න කිරීමකින් තොරව ටෙන්ඩර් පත් පිළිගැනීම හෝ කොටසක් පිළිගැනීම හෝ පිළි නොගැනීමේ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත ඇත.

4. ටෙන්ඩර් පත් දෙපිටපතකින් යුතුව එවිය යුතුය.

ජේ. කේ. පී. ප්‍රනාන්දු,
කෘෂිකර්ම ඉංජිනේරු (නිෂ්පාදන).

වැඩපල හා යන්ත්‍රාගාරය,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1728, කොළඹ 5,
1973. 05. 28.

6–277—73.06.08 දින අංක 63 දරන ගැසට් පත්‍රය

---

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

කොළඹ 5, නාරාහේන්පිට නාවල පාරේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැඩපල හා යන්ත්‍රාගාරයේ කෘෂිකර්ම ඉංජිනේරු තැන විසින් පහත සඳහන් ද්‍රව්‍ය කොළඹ 5 නාරාහේන්පිට වැඩපල හා යන්ත්‍රාගාරයට ගෙනවිත් භාරදීම සඳහා 1973 ජූනි 25 දින සවස 3 දක්වා ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

ඉබේ හැඩගැසෙන පිලම බ්ලොක්හි සවිකරන ලද බෙයාරින් (ඇතුළත විෂ්කම්භය 1¼" ග්‍රීස් කප් සහ ෆ්ලේට් පැකින් සමග) 24 ක් සැපයීම

2. ටෙන්ඩර් පත් මුද්‍රා තැබූ කවරවල එවිය යුතු අතර, කවරයේ උඩ වම් කෙළවරේ "ඉබේ හැඩගැසෙන පිලම බ්ලොක්හි සවිකරන ලද බෙයාරින්" යන්න සඳහන් කර නියමිත වේලාවට පෙර කොළඹ 5 නාරාහේන්පිට, නාවල පාරේ පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැඩපල හා යන්ත්‍රාගාරයේ කෘෂිකර්ම ඉංජිනේරු (සැපයීම්) වෙත එවිය යුතුය.

3. ප්‍රශ්නකිරීමකින් තොරව ටෙන්ඩර්පත් පිළිගැනීම හෝ කොටසක් පිළිගැනීම හෝ පිළි නොගැනීමේ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත ඇත.

4. ටෙන්ඩර් පත් දෙ පිටපතකින් යුතුව එවිය යුතුය.

ජේ. කේ. පී. ප්‍රනාන්දු,
කෘෂිකර්ම ඉංජිනේරු (නිෂ්පාදන).

වැඩපල හා යන්ත්‍රාගාරය,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1728, කොළඹ 5.
1973. 5. 28.

6–275—73.06.08 දින අංක 63 දරන ගැසට් පත්‍රය

### රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය: තැ. පෙ. 418, කොළඹ 2) පහත සඳහන් සේවයන් සඳහා ඒ ඒ දිනයන් හි පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| සේවයන් | ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය |
|---|---|
| 1. මෙරට සාදන ලද පිරිමින්ගේ පාපැදි සැපයීම ... | 1973. 07. 03. |
| 2. 1973. 07. 01 සිට 1973. 12. 31 දක්වා මෙරට සාදන ලද ලියුම් කවර සැපයීම | 1973. 07. 03. |

ලංකා ප්‍රමිතිවලට අනුකූලව නිෂ්පාදිත භාණ්ඩවලට වැඩි සැලකිල්ලක් දක්වනවා ඇත.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

එක් එක් සේවය සම්බන්ධයෙන් රුපියල් 50ක ටෙන්ඩර් තැන්පත් මුදලක් රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් මෙහි ඉදිරිපත් කළ විට ඉහත සඳහන් දිනවලට කලින් දින පෙරවරු 11 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1973 ජූනි මස 8 වැනි දින,
කොළඹ දී ය.

6–311—73.06.08 දින අංක 63 දරණ ගැසට් පත්‍රය

---

### ශ්‍රී ලංකා ගුවන් හමුදාව
### සුන්බුන් උපකරණ විකිණීමේ ටෙන්ඩරය

කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් කටුනායක ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුරේ සැපයීමේ සහ නඩත්තු කිරීමේ ඩිපෝවෙහි තිබෙන සුන්බුන් උපකරණ විකිණීම සඳහා 1973 ජූලි මස 3 වෙනි දින පෙරවරු 10 තෙක් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත් ලබා ගැනීමට ප්‍රථම මෙම මූලස්ථානයේ සිවිල් පාලක හා ගණකාධිකාරී වෙත නැවත ලබාගත හැකි රු. 100ක ටෙන්ඩර් තැන්පත් මුදලක් තැන්පත් කර රිසිට් පතක් ලබාගත යුතුයි. 1973 ජූලි මස 2 වෙනි දින දහවල් 12 තෙක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

වැඩි විස්තර කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයෙන් දැන ගත හැක.

පී. එච්. මැන්දිස්,
එයාර් කොමඩෝර්,
ගුවන් හමුදාපති.

6–312—73.06.08 දින අංක 63 දරණ ගැසට් පත්‍රය

---

### ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව
### 1973 මුදල් වර්ෂයේ දෙවැනි භාගය සඳහා අනුරාධපුර කොට්ඨාශයට ප්‍රාදේශීය ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම

අනුරාධපුර ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කොට්ඨාශයට අයත් අනුරාධපුර, කුරුණෑගල, පුත්තලම සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක වල දැනට පවතින පහත සඳහන් කායඹාංශවලට සහ අලුතින් පිහිටු වීමට බලාපොරොත්තුවන කායඹාංශවලට ප්‍රදේශීය ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීමට අනුරාධපුර ඉඩම් සංවර්ධන නිලධාරි විසින් 1973.06.28 වැනි දින දවල් 12 වන තුරු ටෙන්ඩර් භාරගනු ලැබේ :—

අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් කායඹාංශ : පදවිය, රාජාංගන දකුණු ඉවුර, මහකනදරාව, ඇනාකඩ, මහ විලච්චිය, කැබිතිගොල්ලෑව, මැදවච්චිය සහ අනෙකුත් කායඹාංශ.

කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් කායඹාංශ : රාජාංගන වම් ඉවුර, හක්වටුනාඔය සහ අනෙකුත් කායඹාංශ.

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයට අයත් කායඹාංශ : වාන් ඇල—අල්ලායි සහ අනෙකුත් කායඹාංශ.

පුත්තලම දිස්ත්‍රික්කයට අයත් කායඹාංශ : කිවුල්කැලේ සහ අනෙකුත් කායඹාංශ.

2. ප්‍රාදේශීය ගොඩනැගිලි ද්‍රව්‍ය

(1) ඉරුදෙකේ පොල් අතු (දිග අඩි 7 ක් සහ පළල අඟල් 18 කට නොඅඩු) 1,000 බැගින්.

(2) දිය ගසන ලද හුණු බුසලක් සඳහා (රා. 44 කට නොඅඩු බරක් ඇති)

(3) තම්බාපු හුණු බුසලක් සඳහා

(4) කලුගල් 6″×9″ කියුබ් වලින්

(5) කලුගල් 6″×4″ කියුබ් වලින්

(6) කලුගල් 5″ × 4″ කියුබ් වලින්

(7) කැටගල් 2″ කියුබ් වලින්

(8) කැටගල් 1½″ කියුබ් වලින්

(9) කැටගල් 1″ කියුබ් වලින්

(10) කැටගල් ¾″ කියුබ් වලින්

(11) කැටගල් ½″ කියුබ් වලින්

(12) පිලිස්සූ ගඩොල් (8 3/4″×4 1/2″×2 3/4″ යන ප්‍රමාණයේ) 1,000 බැගින්

(13) ගංගා වැලි කියුබ් වලින්.

(අ) වත්තෙන්/පෝරනුවෙන්/ගල්වලෙන්, මෙය ලොරි යාහැකි සැතපුම් 5 ක් ඇතුලත පිහිටි ස්ථානයක් විය යුතුයි.

(ආ) කොන්ත්‍රාත්කරු විසින්ම වැඩ බිමට ඔහුගේ වාහන වලින් ගෙනැවිත් භාරදීමට (පැටවීම, බෑම සහ නියමිත පරිදි ඇහිරීම ඇතුලුව).

3. එක් එක් දිස්ත්‍රික්කය වෙනුවෙන් රු. 50 ක් මෙම කායඹාලයේ තැන්පත් කිරීමෙන් හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් හෝ අනුමත කරන ලද ටෙන්ඩර් ෆෝර්ම මෙම කායඹාංශයෙන් ලබා ගත හැක. ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලබන්නේ 1973.06.26 වැනි දින දවල් 12 දක්වා පමණි.

4. මෙම කායඹාලයෙන් සපයනු ලබන නියමිත ටෙන්ඩර් ෆෝර්මවල ඉල්ලුම් කළ යුතු අතර, ඒවා ලිපි කවරයක බහා සීල් තබා 1973.06.28 වැනි දින දවල් 12 ට පෙර මෙම කායඹාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීම හෝ "ඉඩම් සංවර්ධන නිලධාරි—අනුරාධපුර" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 73.06.28 වැනි දින දවල් 12 ට පෙර ලැබෙන සේ එවීම කල හැක. ටෙන්ඩර් බහා එවන කවරයේ වම් පස උඩ කෙළවරේ "................. දිස්ත්‍රික්කයට ප්‍රාදේශීය ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩරය" යනුවෙන් සඳහන් කළ යුතුය.

5. 1973.06.28 වැනි දින පස්වරු 2.30 ට අනුරාධපුර ඉඩම් සංවර්ධන නිලධාරි විසින්, ඉඩම් සංවර්ධන කායඹාලයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරනු ලබන වේලාවට ටෙන්ඩර් කරුවන්ට හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතයින්ට හෝ පැමිණ සිටිය හැක.

6. කලුගල් සහ කැටගල් කැඩීම සඳහා අවශ්‍ය පුපුරන ද්‍රව්‍ය මෙම දෙපාර්තමේන්තුව මගින් සපයනු නොලැබේ. නමුත් අවශ්‍ය වන්නේ නම් ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් නිලධාරියෙකුගේ පරීක්ෂාව යටතේ දෙපාර්තමේන්තුව මගින්, වෙඩිබෙහෙත් සපයා ගල් පිපිරවීමට කටයුතු කළ හැක. බෝර ගැසීම, පිපිරවීම හා ඒ සම්බන්ධ අනෙකුත් කටයුතු සහ ඒ සම්බන්ධ සම්පූර්ණ වගකීම කොන්ත්‍රාත්කරු විසින් භාර ගත යුතුය. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ වැඩ සටහන් සහ පහසුව අනුව ගල් පිපිරවීමට කටයුතු කරන අතර, අනුරාධපුර ඉඩම් සංවර්ධන නිලධාරි හෝ ඔහුගේ බලය ලත් නිලධාරියෙකු විසින් නියම කරන දිනයක හා වේලාවක වෙඩි බෙහෙත් දමා පිරවීමට කොන්ත්‍රාත්කරු විසින් සූදානම් කර තැබිය යුතුය. සපයන ලද වෙඩි බෙහෙත් වලට දෙපාර්තමේන්තුව මගින් නියම කරන පරිදි කොන්ත්‍රාත්කරු විසින් කැටගල් සහ කලුගල් සතියක් ඇතුළතදී සැපයිය යුතුය. දෙපාර්තමේන්තුව මගින් සපයන වෙඩිබෙහෙත් වලට සහ වෙඩිලුනුවලට මුදල් අඩුකරනු ඇත.

7. පිළිගනු ලැබූ ටෙන්ඩර්කරුවන් ඒ බව දන්වා සතියක් ඇතුලත අනුරාධපුර ඉඩම් සංවර්ධන නිලධාරි සමග පොරොන්දුවකට බැඳිය යුතු අතර, ඔහු විසින් කරනු ලබන ඇනවුම්වලට අනුව දන්වන දිනයේ සිට සතියක් ඇතුලත ද්‍රව්‍ය සැපයීම කළ යුතුය. මෙම කාලය ඇතුලත පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමට හෝ නියම කිරීමෙන් පසු ද්‍රව්‍ය සැපයීමට හෝ අපොහොසත්වන ටෙන්ඩර්කරුවන්ගේ නම් කොන්දේසිකඩකල ටෙන්ඩර් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් කිරීමට සිදුවන අතර, තැන්පත් මුදලද රජය සතු කිරීමට ඉඩ ඇත.

8. කිසිම හේතුවක් නොදන්වා ටෙන්ඩරයක් හෝ ටෙන්ඩරයක කොටසක් හෝ සියලුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ පිලිගැනීමේ හෝ බලය අනුරාධපුර ඉඩම් සංවර්ධන නිලධාරි සතුය.

9. මේ ගැන වැඩි විස්තර අවශ්‍ය වෙතොත් අනුරාධපුර ඉඩම් සංවර්ධන නිලධාරියාගෙන් ලබාගන්න.

ඒ. ෂන්මුගරාජා,
ඉඩම් සංවර්ධන නිලධාරි,
අනුරාධපුරය.

1973 ක්වූ මැයි මස 28 වැනි දින,
අනුරාධපුර ඉඩම් සංවර්ධන කායභිලයේදීය.

6–278—73.06.08 දින අංක 63 දරණ ගසට් පත්‍රය

---

## තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

### යතුරු පුවරු සඳහා බැටරි එලිමිනේටර්ස් 120ක් සැපයීම

ඉහත සඳහන් ද්‍රව්‍ය සැපයීම සඳහා කොළඹ 1, ලෝටර්ස් පාරේ, තැපැල් සහ විදුලි සන්දේශ මූලස්ථාන ගොඩනැගිල්ලේ, 5 වෙනි මහලේ, තැපැල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශයේ ගැනුම් පත් මණ්ඩලයේ සභාපති විසින් 1973 ජූලි මස 4 දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

(2) කොළඹ 1, ලෝටස් පාරේ, තැපැල් සහ විදුලි සන්දේශ මූලස්ථානයේ, 5 වෙනි මහලේ ප්‍රධාන විදුලි සන්දේශ ඉංජිනේරු කායභිලයෙන් ලබගත් පෝර්ම පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුය. ඉහත සඳහන් කායභිලයේදී ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කර බැලීමට ද අවශ්‍ය විස්තර දැන ගැනීමට ද පුළුවන.

(3) කොළඹ 1, මධ්‍යම විදුලි පණිවුඩ කායභිලයේ කැෂියර් වෙත හෝ තැපැල් කායභිලයක ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 50 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සිය, ප්‍රධාන විදුලි සන්දේශ ඉංජිනේරු කායභිලය වෙත ඉදිරිපත් කිරීමෙන් 1973 ජූනි මස 27 දින දවල් 12 වන තෙක් බලාපොරොත්තුවන ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබා ගත හැකිය.

එච්. බී. ඇස්. ඒ. ගුණවර්ධන,
ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු.

ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කායභිලය,
5 වෙනි මහල,
තැපැල් සහ විදුලි සන්දේශ මූලස්ථානය,
ලෝටස් පාර,
කොළඹ 1,

6–266—73.06.08 දින අංක 63 දරණ ගැසට් පත්‍රය

---

## ධීවර දෙපාර්තමේන්තුව

ධීවර දෙපාර්තමේන්තුවේ උඩවලවේ මිරිදිය ධීවර මධ්‍යස්ථානයේ පහත සඳහන් කාර්යයන් සඳහා 1973. 06. 22 දින පූ. භා. 10. 30 තෙක් කොළඹ, ධීවර අධ්‍යක්ෂ විසින් ටැන්ඩර් පත් භාරගනු ලැබේ :—

(1) සිමෙන්ති ටැංකි (මාළු) 2 ක් තැනීම.
(2) ජලාශයක් තැනීම.
(3) ලිඳක් තැනීම.
(4) ගරාජයක් තැනීම.

ටෙන්ඩර් පත්‍ර 1973 06. 21 වැනි දින දහවල් 12 වන තෙක් කොළඹ, ගාළු මුවදොර, ධීවර දෙපාර්තමේන්තුවේ ආයතන ශාඛාවෙන් ලබාගත හැකිය. එක් එක් ටෙන්ඩර් වෙනුවෙන් ටෙන්ඩර් තැන්පත් මුදල රුපියල් 100 කි. මෙම තැන්පත් මුදල ආපසු ලබාගත හැකිවනු ඇත.

ඒ. අයි. මොහිදින්,
ධීවර අධ්‍යක්ෂ.

1973 මැයි මස වැනි දින,
කොළඹ, ධීවර දෙපාර්තමේන්තුවේ දී ය.

6–176—73–06.08 දින අංක 63 දරණ ගැසට් පත්‍රය

---

## අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ 5, නාරාහේන්පිට පිහිටි පළතුරු කම්හලේ ඇති පාවිච්චි කල නොහැකි ද්‍රව්‍ය විකිණීම සඳහා කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ, බී. එස්. එස්. අයි. ගොඩනැගිල්ලේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973 ජූනි මස 29 දින අ. භා. 2 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

අලෙවි කිරීමේ කොමසාරිස් කායභිලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 100ක මුදලක් තැන්පත් කොට ලබාගන්නා කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් 1973 ජූනි මස 29 වැනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝරම ලබා ගත හැක.

වැඩි විස්තර ඉහත ලිපියේ අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් ලබා ගැනීමට පිළිවන.

සී. ඩී. ප්‍රනාන්දු,
අලෙවි සංවර්න කොමසාරිස් වෙනුවට.

1973 මැයි මස 28 වැනි දින,
කොළඹ 1,
අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුව.

6–313—73.06.08 දින අංක 63 දරණ ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

කොළඹ වරාය කොමිෂන් සභා ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1973 ජූනි මස 29 වෙනි දින පස්වරු 2.30 දක්වා නාත්තන්ඩියේ තලවිල් හි ධීවර නිවාස යෝජනා ක්‍රමය පිටුපසට 9"—12" සක්කගල් කියුබ් 150 ක් සහ අගල් 2 කැලිගල් කියුබ් 15 ක් සපයා භාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. 1973 ජූනි මස 29 වෙනි දින පස්වරු 2.30 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපැලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් ටෙන්ඩර් භාරගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියාට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාර දී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබාගත යුතුය. නැතහොත් ටෙන්ඩර්කරුවන්ට තමන්ගේ ටෙන්ඩර් දෙපාතීමේන්තු ටෙන්ඩර් පෙට්ටියෙහි පුද්ගලිකව තැන්පත් කළ හැක.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛණ කොළඹ වරාය කොමිෂන් සභා කායභිලයේදී පරීක්ෂා කළ හැක. රු. 100 මුදලක් වරාය කොමිෂන් සභා කායභිලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම කොළ ලබාගත හැක. ටෙන්ඩර් කොන්දේසිවලට අනුව ඇති මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබාගත් පෝරම කොළවල ටෙන්ඩර් ඉදිරි පත් කළ යුතුය. 1973 ජූනි මස 27 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

ඇස්. ඇම්. බී. දොලපිහිල්ල,
වැඩ බලන වරාය කොමසාරිස්.

කොළඹ වරාය කොමිෂන් සභාව,
කොළඹ 1.
1973. 06. 08.

6–191—73.06.08 දින අංක 63 දරණ ගැසට් පත්‍රය

**ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය**

උඩවලවේ ව්‍යාපාරයට අවශ්‍ය පුපුරවන ද්‍රව්‍ය සහ ගල් විදින බෝර කටු යනාදිය සැපයීම

ටෙන්ඩර් අංක ජී. 15

**ටෙන්ඩර් අවසාන දිනය : 1973 සැප්තැම්බර් 7 වෙනි දින**

1. උඩවලවේ යෝජනා ක්‍රමයට අවශ්‍ය මාතක උපකරණ සැපයීම සහ භාරදීම සඳහා ලංකාවේ, කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ, අංක 415, දරණ ස්ථානයේ පිහිටි ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයේ. මධ්‍යම ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973 සැප්තැම්බර් 7 වෙනි සිකුරාදා පෙ. ව. 10 තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. මෙම සැපයීම් ලබා ගැනීම සඳහා මුදල් යොදවනු ලබන්නේ ආසියානු සංවර්ධන බැංකුවේ විශේෂ අරමුදල් සම්පත්වල ණය මුදලින් බැවින්, ලබාගත යුතු යෝග්‍ය ස්ථානවල සැපයුම්කරුවන්ගෙන් සහ ඔවුන් වෙනුවෙන් පමණක් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

3. විශේෂ අරමුදල් සම්පත් වලින් සැපයීම් ලබාගන්නේ පහත සඳහන් යෝග්‍ය ස්ථාන වලිනි :—ඕස්ට්‍රේලියාව, බෙල්ජියම, කැනඩාව, ඩෙන්මාර්කය, ජර්මන් සමූහාණ්ඩුව, ජපානය, නෙදර්ලන්තය, එක්සත් රාජ්‍යය සහ ආසියානු සංවර්ධන බැංකුවෙන් සංවර්ධනය වන සාමාජික රටවල් :—(ඇෆ්ගනිස්ථානය, හොංකොං, ඉන්දියාව, ඉන්දුනීසියාව, කෝමර් සමූහාණ්ඩුව, දකුණු කොරියන් සමූහාණ්ඩුව, ලාඕස්, මැලේසියාව, නේපාලය, පකිස්ථානය, චීන සමූහාණ්ඩුව, (තායිවානය) ෆීජී, පිලිප්පීනය, සිංගප්පූරුව, තායිලන්තය, ටොන්ගාව, බටහිර සමෝවාව, පපුවා සහ නිව්ගිනියා දේශ සීමාව, වියට්නාම සමූහාණ්ඩුව ( සයිගොන් ).

4. සම්පූර්ණ විස්තර සහ ටෙන්ඩර් ලියකියවිලි කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ, අංක 415, දරණ ස්ථානයේ පිහිටි ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ, මධ්‍යම ටෙන්ඩර් මණ්ඩලයේ ලේකම්ගේ කාර්යාලයෙන් ලබාගත හැක.

5. ටෙන්ඩර් ලියකියවිලි පහත සඳහන් තානාපති කාර්යාල වලින්ද ලබාගත හැක :—

(අ) ඕස්ට්‍රේලියාවේ ලංකා මහ කොමසාරිස්තුමා

(ආ) කැනඩාවේ ලංකා මහා කොමසාරිස්තුමා

(ඇ) ඩෙන්මාර්කයේ සිටින ලංකා කොන්සල් ජනරාල්තුමා

(ඈ) ජර්මන් පෙඩරල් සමූහාණ්ඩුවේ සිටින අතිගරු ලංකා තානාපතිතුමා, බෙල්ජියම සහ නෙදර්ලන්තය

(ඉ) ජපානයේ සිටින ලංකා මහ කොමසාරිස්තුමා

(ඊ) එක්සත් රාජධානියේ සිටින ලංකා මහ කොමසාරිස්තුමා

(උ) ඉන්දියාවේ සිටින ලංකා මහ කොමසාරිස්තුමා

(ඌ) ඉන්දියවේ බොම්බායේ සිටින ගරු වෙළඳ කොමසාරිස්තුමා

(එ) ඉන්දුනීසියාවේ සිටින අතිගරු ලංකා තානාපතිතුමා

(ඒ) සියුල්හි කොරියන් සමූහාණ්ඩුවේ සිටින ආර්ථික සහයෝගතා පිළිබඳ අධ්‍යක්ෂතුමා

(ඔ) මලයාසියාවේ සිටින ලංකා මහා කොමසාරිස්තුමා

(ඕ) බටහිර පකිස්ථානයේ සිටින ලංකාවේ වෙළඳ කොමසාරිස්තුමා

(ක) ලංකා තානාපතිතුම, මැනිලා, පිලිපයින්ස්

(කා) ගරු වෙළඳ කොමසාරිස්තුමා, සිංගප්පූරුව

(කැ) සංවර්ධන අධ්‍යක්ෂ ජාත්‍යන්තර සහයෝගතා සහ සංවර්ධන මණ්ඩලයේ මුදල් අංශය, ටයිපෙයි, චීන සමූහාණ්ඩුව.

(කෑ) තයිලන්තයේ ලංකා නියෝජිත තානාපතිතුමා

(කි) විදේශ අමාත්‍යාංශය, සයිගොන් වියට්නාමය

(කී) ලංකා තානාපතිතුමා, බුරුමය

යෝග්‍ය ස්ථානවල ප්‍රධානීන් වෙනුවෙන් ටෙන්ඩර් පත් ඉදිරිපත් කරන මෙරට නියෝජිතයින් විසින් ටෙන්ඩර් ලියකියවිලි කට්ටලයක් වෙනුවෙන් ආපසු ගෙවනු ලබන රු. 250 ටෙන්ඩර් තැන්පත් මුදලක් ද, අවලංගු කරන ලද මින් එක් එක් කට්ටලයක් වෙනුවෙන් රු. 5ක ගාස්තුවක් ද, ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන ගණකාධිකාරීට මුදලින් ගෙවිය යුතුය.

සභාපති,
මධ්‍යම ටෙන්ඩර් මණ්ඩලය,
ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය.

තැ. පෙ. 524,
කොළඹ 7.
1973 ජූනි මස 8 වෙනි දින.

6–308—73.06.08 දින අංක 63 දරණ ගැසට් පත්‍රය

---

**සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මඩකලපුව කොට්ඨාශය**

කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1973 ජූලි 1 වැනිද සිට 1973 දෙසැම්බර් 31 වනද දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ, මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයුම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර මඩකලපුවේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරී තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයෙහි දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමූපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධසේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදල් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනයට පළමු දිනයෙහි දහවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍යය සේවා අධිකාරීවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැකිය. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත්කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත් කල් වේලා ඇතිව එවිය යුතුය.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට සැලකිය යුතු කාලයට ප්‍රථම තම වත්කම් මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා උවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡේදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල් අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැනගැනීමට මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුක්තව කවරයක බහා '' සෞඛ්‍ය සේවා අධිකාරී, මඩකලපුව '' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළෙවරේ එය කවර සේවාවක් සඳහා දැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම, එහි වම් පස කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචිකළ තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරී/ලේකම් තැනට භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුන බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර් පත් බාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වැනි තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්‍යාලයේදී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කලින් පිළියෙළ කරගත් දිනක මවිසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි තීරණය.**—ටෙන්ඩර්පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝරමයේ '' බී '' උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයුම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝරමයෙහි ''සී'' උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳපොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිලක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.** —ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවැනි ඡෙදයේ සඳහන් කාල සීමාව ඉකුත්වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැතිනම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයේ සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

11. **බඩුබාහිරාදිය තබාගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩුබාහිරාදිය ගබඩා කර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවෙකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතු ද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමෙහි කොන්දේසි ටෙන්ඩර් කරුවන් විසින් සැලකිය යුතුය.

13. (i) රෝගියෙකුගේ සම්පූර්ණ ආහාර වේලකට සහල් අවුන්ස 3½ක් ඇතුළත් වන සේ බත් වේල් සැපයුමට ටෙන්ඩර්කරුවන් මිළ ගණන් දක්විය යුතුය.

(ii) අවශ්‍ය සහල් ආහාර කොමසාරිස් විසින් සළාක නොවන මිළට සපයන අතර ඒ සඳහා ටෙන්ඩර්කරු ආහාර කොමසාරිස් විසින් නියෝග විටින් විට නියෝග කරන ලද මිලට ටෙන්ඩර්කරු මුදල් ගෙවිය යුතුය. පරිත්‍යාග කරන ලද සහල් හෝ නොමිලයේ සහල් හෝ පිසීම සඳහා කොන්ත්‍රාත්කරුට සැපයුව හොත් ඒ සඳහා සලාක නොවන සහල් මිලට කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් මුදල් අඩු කරනු ලැබේ.

කිසිම අවස්ථාවකදී සලාක සහල් සැපයුවහොත් ඒ සහල් සඳහා සළාක මිලට කොන්ත්‍රාත්කරු විසින් මුදල් ගෙවිය යුතුය. ඒ අතර සලාක නොවන සහල් මිළේ සහ සලාක සහල් මිළේ වෙනය කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් අඩු කරනු ලැබේ.

(iii) කූපන් භාර නොදුනහොත් සේවකයන්ට සැපයිය යුත්තේ පාන්ය. කූපන් භාරදුනහොත් ඒ වෙනුවෙන් නොසපයනු ලබන පාන් සඳහා පහත සඳහන් පරිදි කොන්ත්‍රාත්කරුගේ වවුචරයෙන් මුදල් අඩුකරනු ලැබේ :—

(අ) කූපන්වලට ලබාගන්නා සහල් දනට මෙන් නොමිලයේ වුවහොත් නොසපයනු ලබන පාන්වල සම්පූර්ණ වටිනාකම අඩු කරනු ලැබේ.

(ආ) එවැනි කූපන්වලට සහල් නිකුත් කරන්නේ කොන්ත්‍රාත්කරු ගෙවන සලාක මිලට නම් නොපසයනු ලබන පාන්වල මිළෙත් සලාක සහල් මිළේත් වෙනස අඩුකරනු ලැබේ.

1973 මැයි 20 වෙනි දින,
මඩකලපුවේ සෞඛ්‍ය සේවා අධිකාරිගේ කාර්යාලයේදීය.

කේ. සත්කුරු,
මඩකලපුවේ සෞඛ්‍ය සේවා අධිකාරි.

**උපලේඛනය**

| (1) ආයතනය | | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල | (3) ඇප මුදල | (4) ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය | (5) ආහාර ප්‍රමාණය දළ වශයෙන් | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | සේවකයින්ට | | | | රෝගීන්ට | | | |
| පිසූ ආහාර | | රු. | රු. | | මාළු | කරවල | බිත්තර | එළවළු | මාළු | කරවල | බිත්තර | එළවළු |
| මන්ඩපකඩි ග්‍රාමීය රෝහල | ... | 100 | 300 | 1973 ජූනි මස 23 වෙනි දින පෙ.ව.10ට | 224... | 448... | 224... | 672... | 336... | 672... | 336... | 1,008 |
| අක්කරපත්තු මාතෘ නිවාසය | ... | 100 | 300 | | 135... | 271... | 138... | 414... | 123... | 252... | 129... | 389 |
| තිරුක්කෝවිල් මාතෘ නිවාසය | ... | 100 | 300 | | 168... | 353... | 191... | 564... | 57... | 111... | 55... | 193 |
| නාවක්කාඩු මාතෘ නිවාසය | ... | 100 | 300 | | 155... | 306... | 152... | 455... | 72... | 150... | 83... | 246 |
| ලාහුගල මාතෘ නිවාසය | ... | 100 | 300 | | 175... | 337... | 167... | 501... | 240... | 516... | 249... | 702 |

6–202—73.06.08 දින අංක 63 දරණ ගැසට් පත්‍රය

---

**ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය**

**කන්තලේ සීනි කර්මාන්තායතනය සඳහා යන්ත්‍ර සහ උපකරණ සැපයීම**

ඉහත සඳහන් කර්මාන්තායතනයට යන්ත්‍ර සහ උපකරණ සැපයීම සඳහා ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය විසින් ටෙන්ඩර් කැඳවනු ලැබේ. 1971 (අංක IV) ඉන්දු /ලංකා ණය යටතේ යන්ත්‍ර සහ උපකරණ මිල දී ගැනීම සඳහා මුදල් සපයනු ලැබේ.

ටෙන්ඩර් ලියකියවිලි, විස්තර අනිසුත් කරුණු 1973 ජූනි මස 01 වෙනි දින සිට පහත සඳහන් අයගෙන් කොළඹ 5, නො. 651, ඇල්විටිගල මාවතේ පිහිටි ප්‍රධාන කාර්‍යාලයෙන් ලබා ගත හැක.

සභාපති,
ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය.

651, ඇල්විටිගල මාවත,
කොළඹ 5.

6–262—73.06.08 දින අංක 63 දරණ ගැසට් පත්‍රය

### කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

කොළඹ—1, හේමාස් ගොඩනැගිල්ල, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් දේශීය නිෂ්පාදකයින්ගෙන් පහත සඳහන් ද්‍රව්‍ය සැපයීම සඳහා 1973. 6. 27 දින පෙ. ව. 10 වන තෙක් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

(අ) තිරුවාන ගල් — ටොන් 24 යි.

(ආ) ඩොලොමයිට් — ටොන් 2 යි.

2. ටෙන්ඩර් කරුවන් විසින් මෙම ද්‍රව්‍ය මොරටුවේ, වෙලෝනාගී කාර්මික වැඩපොළට ගෙන ගොස් බාරදීමට ටොන් එකක් සඳහා මිල ගණන් දැක්විය යුතුයි.

3. සියලුම ටෙන්ඩර් කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ හේමාස් ගොඩනැගිල්ලේ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත, 1973. 6. 27 දින පෙ. ව. 10 ට පෙර ලැබෙන ලෙස එවිය යුතුයි. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "තිරුවානගල් හා ඩොලොමයිට් සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කළ යුතුයි.

4. 1973. 6. 27 දින පෙ. ව. 10 ට පසුව කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර් කරුවන්ට එහි පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

1973. 5. 28
යොමු අංකය—3/1—(4/37),
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ.

6–283—73.06.08 දින අංක 63 දරණ ගැසට් පත්‍රය

---

## බඩු බාහිරාදිය විකිණීම්

### ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

ප්‍රයෝජනයට ගත නොහැකි බඩු බාහිරාදිය වෙන්දේසියේ විකිණීම

1973. 6. 16 වැනි දින, පෙරවරු 10 ට කොළඹ 1, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ, අංක 7 දරන ස්ථානයේ පිහිටි, ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ දී, මෙහි පහත සඳහන් ප්‍රයෝජනයට ගත නොහැකි විෂයයන් ප්‍රසිද්ධ වෙන්දේසියක් මගින් විකුණනු ලැබේ.

(1) පරණ මෝටර් රථ ටයර්—75 (සියළුම ප්‍රමාණයේ ඒවා),

(2) පරණ මෝටර් රථ ටියුබ්—50 (සියළුම ප්‍රමාණයේ ඒවා).

මෙම වෙන්දේසියේ බඩු මිළ දී ගන්නා අය විසින් එකී බඩු සම්පූර්ණ මුදල ගෙවා ලබාගත යුතු වන අතර, එසේ ලබාගත් බඩු වෙන්දේසිය පවත්වනු ලබන දිනයේ අ. භා. 2 ට ප්‍රථම වෙන්දේසි භූමියෙන් ඉවතට ගෙන යා යුතුය. තමන් ලබාගත් බඩු සඳහා ගෙවන මුදල් චෙක්පත් වලින් භාර ගනු නො ලැබේ.

වෙන්දේසියේ විකිණීම සඳහා තබා ඇති බඩු, වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට, දින තුනක් පෙරාතුව සිට පරීක්ෂා කර බැලීම සඳහා ඉහත ලිපිනය සඳහන් ස්ථානයේ තබනු ලැබේ.

ප්‍රවෘත්ති අධ්‍යක්ෂ.

1973 මැයි මස 23 දින,
කොළඹ 1,
ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ දීය.

6–290—73.06.08 දින අංක 63 දරණ ගැසට් පත්‍රය

---

### රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

ලොරි, වෑන් සහ කාර් ආදී රථ වාහන 20ක් පමණ 1973 ජූනි මස 27 වැනි බදාදා පෙරවරු 9.30 ට කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම වාහන ඉහත සඳහන් ස්ථානයේදී කාර්යාල වේලාවන්හිදී පරීක්ෂාකර බැලිය හැක.

වැඩි විස්තර රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ සැපයීම් අධ්‍යක්ෂගේ කාර්යාලයෙන් ලබාගත හැක.

ඈස්. ඒ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1973 ජූනි මස 8 දින,
කොළඹදී ය.

6–281—73.06.08 දින අංක 63 දරණ ගැසට් පත්‍රය

---

### රේගු වෙන්දේසිය

අංක 25 ශ්‍රී 2756 දරණ පාවිච්චි කරන ලද "මැසේ පර්ගියුසන්" ට්‍රැක්ටරය සහ අංක 55 ශ්‍රී 4502 දරණ ට්‍රේලරය 1973.06.19 වැනි දින පෙ. ව. 9.30 ට වවුනියා කච්චේරියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

තීන්දු කරන වැඩිම මිලෙන් සියයට 50 ක් ඉල්ලුම්කරු විසින් මුදලින් තැන්පත් කළ යුතු අතර, වෙන්දේසිය අනුමත වූ දින සිට දින හතකින් වාහන ඉවත් කර නොගතහොත් එවා නැවත විකුණනු ලබනවාත් මෙන්ම, ඔවුන් විසින් ගෙවන ලද මුදල රාජ සන්තක කරනු ලැබේ.

1954 මැයි 28 දින පළ වූ රජයේ ගැසට් නිවේදනයේ සඳහන් කොන්දේසි අනුව, වෙන්දේසිය පවත්වනු ලැබේ.

එල්. පී. වික්‍රමාරච්චි,
රේගු අයකැමි,
වවුනියා දිස්ත්‍රික්කය.

1973 මැයි මස 29 වැනි දින,
වවුනියා දිසාපති කාර්යාලයේ දී ය.

6–304—73.06.08 දින අංක 63 දරණ ගැසට් පත්‍රය

---

### කැලෑ දෙපාර්තමේන්තුව

වෙන්දේසි දැන්වීමයි

තොග 8 කින් සමන්විත මිල්ල, කොස්, පෙලන්, ලියන්, හැඩවක මලබඩ ආදී වර්ගවලට අයත් දැව ඝන අඩි 5874.7 ක් 1973 ජූනි මස 25 වෙනි දින පෙරවරු 10.00 ට මවිසින් හැටන් අඩවි වන කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. වෙන්දේසියට පෙර එම දැව පරීක්ෂා කර බලන ලෙස අයදුම් කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

3. වැඩි විස්තර මගෙන් හෝ හැටන් අඩවි වන නිලධාරීගෙන් ලබා ගත හැක.

කේ. පී. ශ්‍රී. භාරතී,
ඌඩරට දිසා වන නිලධාරී.

1973 අප්‍රේල් මස 28 දින,
නුවරඑළියේ,
උඩරට දිසා වන කාර්යාලයේ දී ය.

6–225—73.06.08 දින අංක 63 දරණ ගැසට් පත්‍රය

## රේගුවේ වෙන්දේසියක්

කොළඹ, රේගුවේ පිටකොටුව ගුදමෙහි තැන්පත් පහත සඳහන් බඩු 1973 ජූනි මස 19 වෙනි දින පෙ. ව. 9.30 ට එම ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. 1973 ජූනි 18 වැනි දින එම බඩු ගැනුම්කරුවනට පරීක්ෂා කර බැලීමට පිළිවන.

ඉල්ලීම අවසානයේදී වැඩිම ඉල්ලුම්කරු විසින් මිළයට ගන්නා භාණ්ඩයෙහි වටිනාකමින් 50% ක මුදලක් තැන්පත් කළ යුතුය.

මෙම වෙන්දේසියෙන් මිළයට ගන්නා බඩු වෙන්දේසිය අනුමත කර දින හතකින් ගෙන නොගියහොත් එම බඩු නැවත විකුණන බවත්, ඒ සඳහා ගෙවා ඇති අත්තිකාරම් මුදල් රාජසන්තක වන බවත් සැළකිය යුතුය.

වෙන්දේසිය පිළිබඳ අනිකුත් කොන්දේසි සඳහා 1954 මැයි මස 28 වෙනි දින ගැසට් පත්‍රය බලන්න.

ටී. බී. ඒ. දසනායක,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය : ඒ ඩී/විකිණීම්/96
1973 මැයි මස 15 වන දින,
කොළඹ, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

1. රසායන ද්‍රව්‍ය පීප්ප 1 යි
2. ගැල්වනයිස්ඩ් කම්බි රෝල් 1 යි
3. රසායන ද්‍රව්‍ය පීප්ප 2 යි
4. යකඩ පට්ටම් රෝල් 1 යි
5. රේඩියේටර් 2 යි
6. සයිලන්සර් පයිප්ප 1 යි
7. සායම් ටින් 1 යි
8. විදුලි උපකරණ පාර්සල් 1 යි
9. ගල්කුරු මළු 1 යි -
10. දොර අගුල් කොටස්, මහන නූල්, රබර් වොෂර් හා ආදී මළු 1 යි
11. (රැවුල බෑම සඳහා) බුරුසු ආදී මළු 1 යි
12. බෝලාකාර වීදුරු 2 යි
13. (පයිරෙක්ස්) වීදුරු පිඟන් 12 යි
14 සීෂ්ට් ටින් මළු (කැඩීඇත) 1 යි
15. රථවාහන අමතර කොටස් පෙට්ටි 1 යි
16. දන්තාලේප සෑදීමට ගන්නා කුඩු මළු 2 යි
17. රථවාහන අමතර කොටස් පෙට්ටි 1 යි
18. ෆ්ලොරසන්ස් ට්‍යුබ් කාඩ්බෝඩ් පෙට්ටි 1 යි.
19. සෞඛ්‍ය සවිකරණ (කොමෝඩ්) කැඩුණු 1 යි
20. පරණ ඇඳුම් මළු 1 යි
21. හිස් ප්ලාස්ටික් භාජන 2 යි
22. ගන නූල් බණ්ඩල් 1 යි
23. ටින් තහඩු ගොඩක්
24. කම්බි රෝල් 4 යි
25. දමේබටු ගෝනි මළු 9 යි
26. මැලියම් පෙට්ටි 2 යි
27. පියර කුඩු මළු 17 යි
28. යන්ත්‍ර කොටස් පෙට්ටි 1 යි
29. වඩු උපකරණ පෙට්ටි 1 යි
30. පරණ මුද්‍රණ පොත් පෙට්ටි 1 යි
31. යන්ත්‍ර කොටස් පෙට්ටි 1 යි
32. පරණ මුද්‍රණ පොත් පෙට්ටි 1 යි
33. පරණ මුද්‍රණ පොත් පෙට්ටි 1 යි
34. වෙල්ඩින් කූරු පෙට්ටි 1 යි
35. කිරිපිටි (මයිලෙක්ස්) කාටුන් 21 යි
36. රසායන ද්‍රව්‍ය ටින් 1 යි
37. වොඩින් රෝද-ගෝනි මළු 1 යි
38. හිස් පීප්ප 1 යි
39. විකර්ස් තෙල් පීප්ප 1 යි
40. තල ඇට ගෝනි මළු 6 යි
41. පූනක්කු මළු 1 යි
42. පින්චර් බෙන්සයින්කෑම් 1 යි.
43. හිස් බෝතල් පෙට්ටි 1 යි
44. මයිනහම් 1 යි
45. යන්ත්‍ර කොටස් කාටුන් 1 යි
46. රථවාහන අමතර කොටස් පෙට්ටි 1 යි
47. මැලියම් පටි මළු 3 යි
48. ස්වැන්සිල් පෙට්ටි 3 යි

6–188—73.06.08 දින අංක 63 දරණ ගැසට් පත්‍රය

---

## රේගුවේ වෙන්දේසියක්

කොළඹ, රේගුවේ හැමිල්ටන් හැගර් ගුදමෙහි තැන්පත් පහත සඳහන් බඩු 1973 ජූනි මස 14 වෙනි දින පෙ. ව. 10 ට එම ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. 1973 ජූනි මස 13 වෙනි දින එම බඩු ගැණුම්කරුවනට පරීක්‍ෂා කර බැලීමට පිළිවන.

ඉල්ලීම අවසානයේදී වැඩිම ඉල්ලුම්කරු විසින් මිළයට ගන්නා භාණ්ඩයෙහි වටිනාකමින් සියයට 50 ක මුදලක් තැන්පත් කළ යුතුය.

මෙම වෙන්දේසියෙන් මිළයට ගන්නා බඩු වෙන්දේසිය අනුමත කර දින හතකින් ගෙන නොගියහොත් එම බඩු නැවත විකුණන බවත්, ඒ සඳහා ගෙවා ඇති අත්තිකාරම් මුදල් රාජසන්තක වන බවත් සැලකිය යුතුය.

වෙන්දේසි පිළිබඳ අනිකුත් කොන්දේසි සඳහා 1954 මැයි මස 28 වෙනි දින ගැසට් පත්‍රය බලන්න.

ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය : ඒ ඩී/විකිණීම්/97
1973 මැයි මස 15 වන දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේදී ය.

1. රත් හඳුන් කැබලි මිටි 2 යි
2. යකඩ තහඩු කැබලි 5 යි
3. රසායනාගාර උපකරණ (අබලන්වූ) පෙට්ටි 1 යි
4. ට්‍රැක්ටර් ටියුබ් 5 යි
5. අමතර කොටස් (පිස්ටන්) පෙට්ටි 1 යි
6. රෙදි වීවීමේ යන්ත්‍ර කොටස් (ලී) මිටි 1 යි
7. කඩදාසි රීල් 1 යි
8. කපු නූල් පෙට්ටි 1 යි
9. වයර් පන්දු (හොණ්ඩරයක් පමණ) තොග 1 යි
10. සහල් පාහින යන්ත්‍ර කොටස් පෙට්ටි 1 යි
11. සහල් පාහින යන්ත්‍ර කොටස් පෙට්ටි 3 යි
12. කුෂන් දුණු පෙට්ටි 1 යි
13. ලෝහ බන්දේසි පෙට්ටි 1 යි
14. විදුලි කේතල (අබලන්වූ) පෙට්ටි 1 යි
15. පොට් කැබලි පෙට්ටි 1 යි
16. කිරිගරුඬ කැබලි (අතුගා එකතු කල හො. 7ක් පමණ) මලු 7 යි
17. යකඩ සහ වානේ කම්බි (හො. 25 ක් පමණ) තොග 1 යි
18. බීඩි කොල මලු 138 යි
19. බීඩි කොල මලු 420 යි
20. පයිප්ප (ස්ටෝන්වෙයාර්) හො. 10 ක් පමණ කැබලි 293 යි
21. පයිප්ප (ස්ටෝන්වෙයාර්) කැබලි 1 යි
22. පයිප්ප (ස්ටෝන්වෙයාර්) හො. 4 ක් පමණ කැබලි 73 යි
23.
24. දේශීය බෙහෙත් ද්‍රව්‍ය මලු 2 යි
25. හණ (හො. 375ක් පමණ) තොග 1 යි
26. කොහු කෙඳි (හො. 139 ක් පමණ) තොග 1 යි
27. ලාම්පු චිම්නි තොග 1 යි
28. අත් ආයුධ මලු 2 යි
29. යකඩ බ්‍රැකට් මලු 2 යි
30. නාන කාමර උපකරණ කැබලි 1 යි
31. හිස් වීදුරු බෝතල මලු 1 යි
32. වීදුරු භාජනවල අඩංගු බෙහෙත් පෙට්ටි 2 යි
33. පෝට්ලන්ඩ් සිමෙන්ති උර 3 යි
34. මිණුම් උපකරණ යනාදිය පෙට්ටි 1 යි
35. ඇමෝනියා මලු 1 යි
36. වෝටර් පම්පින් ඒජන්ට් මලු 1 යි
37. කාබන් බ්ලැක් (අතුගා එකතු කල හො. 4 ක් පමණ) මලු 4 යි
38. සෝඩියම් කාබනේට් (අතුගා එකතු කල හො. 40ක් පමණ) මලු 40 යි
39. පොලිතීන් කැට මලු 6 යි
40. පොලිතීන් කැට (අතුගා එකතු කල) මලු 50 යි
41. සෝඩා ඈෂ් (හො. 50ක් පමණ) මලු 40 යි
42. පයිප්ප (ස්ටෝන්වෙයාර්) කැබලි 24 යි

6–187—73.06.08 දින අංක 63 දරණ ගැසට් පත්‍රය

### රේගුවේ වෙන්දේසියක්

කොළඹ, රේගුවේ බණ්ඩාරනායක තටාකයේ (තැන්පත් ගුදමෙහි 2 සහ 3) තැන්පත් පහත සඳහන් බඩු 1973 ජූනි මස 26 වැනි දින පෙ. ව. 9.30 ට එම ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. 1973 ජූනි මස 25 වැනි දින එම බඩු ගැනුම්කරුවනට පරීක්ෂා කර බැලීමට පිළිවන.

ඉල්ලීම අවසානයේදී වැඩිම ඉල්ලුම්කරු විසින් මිළයට ගන්නා භාණ්ඩයෙහි වටිනාකමින් 50% ක මුදලක් තැන්පත් කළ යුතුය.

මෙම වෙන්දේසියෙන් මිළයට ගන්නා බඩු වෙන්දේසිය අනුමත කර දින හතකින් ගෙන නොගියහොත් එම බඩු නැවත විකුණන බවත්, ඒ සඳහා ගෙවා ඇති අත්තිකාරම් මුදල් රාජසන්තක වන බවත් සැළකිය යුතුය.

වෙන්දේසි පිළිබඳ අනිකුත් කොන්දේසි සඳහා 1954 මැයි මස 28 වෙනි දින ගැසට් පත්‍රය බලන්න.

ඊ. බී. ඒ. දසනායක,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය. ඒ බී/විකිණීම්/99,
1973 මැයි මස 23 වන දින,
කොළඹ, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ දී [illegible].

1. හිස් පීප්ප 22 යි
2. හිස් ලෑලි පෙට්ටි 12 යි
3. රසායන ද්‍රව්‍ය පීප්ප 1 යි
4. හිස් ලෑලි බාල්දි 1 යි
5. පට්ටම් යකඩ තොග 1 යි
6. යකඩ කොකු පෙට්ටි 1 යි
7. ප්ලාස්ටික් සායම් බඳුන් 2 යි
8. නූල් රෝද (පලුදු) තොග 1 යි
9. හිස් බෝතල් ගෝනි මලු 1 යි
10. හිස් ගැලුමේ ටින් 20 යි
11. කාඩ් බෝඩ් තොග 1 යි
12. රසායන ද්‍රව්‍ය පීප්ප 1 යි
13. ප්ලාස්ටික් බොබින් පෙට්ටි 1 යි
14. යකඩ මුරුච්චි තොග 1 යි
15. පරණ ලියකියවිලි පෙට්ටි 1 යි
16. බොස්ටන් කුවික් බ්ලැක් පෙට්ටි 1 යි
17. විදුලි පංකා කවර (විශාල) 1 යි
18. ජොසින් බොක්ස් කම්පවුන්ඩ් පෙට්ටි 1 යි
19. කඩදාසි රෝල් 3 යි
20. ඝන කඩදාසි පැලට් 5 යි
21. එක්ස්සෝස්ට් පයිප්ප 5 යි
22. දුඹුරු කඩදාසි තොග 1 යි
23. රසායන ද්‍රව්‍ය සහ පොහොර (මිශ්‍රිත)
24. පෝරනු ගඩොල් පෙට්ටි 1 යි
25. සැනටෝජන් පෙට්ටි 1 යි
26. කවරයක් සහිත වීදුරු බඳුන් පෙට්ටි 1 යි
27. හිස් බෝතල් ගෝනි මලු 1 යි.

6–189—73.06.08 දින අංක 63 දරණ ගැසට් පත්‍රය

---

### රේගු වෙන්දේසියක්

73. 06. 28 වැනි දින පෙ. ව. 9.30 ට පහත සඳහන් බඩු එෆ් 2 ගුදමේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම බඩු 73. 06. 27 වැනි දින පෙ. ව. 10.00 සිට දවල් 12.00 දක්වා පරීක්ෂා කළ හැකිය. භාණ්ඩයක් විකිණීමේදී සාර්ථක ලංසුව තබන්නා විසින් ඉහලම ලංසුවෙන් 50% ක් වෙන්දේසිය අවසන් වූ වහාම මුදලින් තැන්පත් කළ යුතුය.

විකිණීමේ කොන්දේසි සඳහා 1954 මැයි මස 28 වැනි දින ආණ්ඩුවේ ගැසට් පත්‍රය බලන්න.

ඊ. බී. ඒ. දසනායක,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය : පීබ/විකිණීම 33/73.
ශ්‍රී ලංකා රේගුව,
කොළඹ, 1973 මැයි මස 21 වැනි දින.

1. 1" ලාම්පු තිර රෝල් 71 ක්.
2. අනුකරණ පයිලට් පෑන් දුසිම් 269.
   'වෙල්ටෙක්ස්' උල්පත් පෑන් දුසිම් 13.
3. සූට්කේස් එකක බහා ඇති බෝල් පොයින්ට් කූරු 24×144.
4. අනුකරණ පෙන්ඩන්ට් 3500 ක්.
5. 'කොම්ප්ලමින්' ෂෙනි බෝතල 9 ක්.
6. ඇස් බැම් පාට පැන්සල් 48.
   ඇස්බැම් පැන්සල් 136.
7. කොණ්ඩා කටු කාඩ් 1770×36.
   'රෝස්මේරි' කොණ්ඩා කටු කාඩ් 1850×24.
8. ගුලා තලච් 4 (එ. රු.).
9. බඳුන් 2 ක්, ලෝහ බඳුන් 1 ක්.
10. 'ඩන්ලොප්' වෘක්ටර් පියුබ් 2 ක්.
11. ජොලි ස්වෙටර් 2 ක්, තඹ කොල කෑලි 9 ක්, යන්ඩි කෑලි 23 ක්, පේෂකම් මැෂින් සඳහා අවශ්‍ය අමතර කොටස් සෙට් 6 ක්.
12. මෝටර් රථ අමතර කොටස් කෑලි 6 ක් (ජොයින්ට්ස්).
13. සීස්ට් ටින් 95 ක්.
14. කාබන් බ්ලැක් බෑග් 6 ක්.
15. මහතුන්ගේ නාන ඇඳුම් 1 ක්, කලිසම් රෙදි 1 ක්.
16. මුරිච්චි යතුරු කට්ටල් 8 ක්, සිරුමාරු යතුරු 3 ක්.
17. සුදු 'ඩ්රිල්' යාර 7 ක් (කුණු ගෑවී ඇත).
18. 13 ප්‍රමාණයේ 'වයලා' කමිස 1 ක්.
19. 'පෙරිකොලේස්' කැප්සියුල් බෝතල් 6 ක්.
20. විටමින් සී ඉන්ජෙක්සන් පෙට්ටි 90 ක්, (එකක 10 යුත් කාඩ් සහ වෙනම 30 ක් ඇත).
21. නයිලෝන් සැටින් රෝල් 2 ක් (කුණු ගෑවී ඇත.)
22. සාරි මල් 113 ක්.
23. නවත්වන වැල්වයන් 20 ක්.
24. රේඩියෝ වැල්ව් 6 ක්.
25. රු. 130 ක් බර වෙල්ඩින් කූරු පැකැට් 17 ක්.
26. සයිකල් පුනු (හබ්) 1 ක්.
27. කලිසම් රෙදි 1 ක්.
    ඉන්දියන් නයිලෙක්ස් සාරි 1 ක්.
28. ¼" කපු ලේස් පැකැට් 48 ක්.
    ½" —එම— 28 ක්.
    1" —එම— 8 ක්.
    2" —එම— 85 ක්.
    2¼" —එම— 58 ක්.
    3" —එම— 4 ක්.
29. "කොනියන්" ට්‍රාන්සිස්ටර් රේඩියෝ 1 ක් (මුහුදේ තිබී ආපසු ලබාගෙන ඇත.)
30. කිඩ් කොල රාත්තල් 10 ක්.
31. කුරුඳු තෙල් බෝතල් 2 ක්, ගම්මිරිස් සහ කරාබු පාර්සල් 1 ක්, සිලොන්ටා තේ රාත්තල් 4 ක්.
32. පබලු වලින් වැඩ දමා ඇති රෙදි බෑග් 1 ක්.
33. සිගරට් කොල පැකැට් 100 ක්.
34. තාපදීප්ත මැන්ටල් 1929 ක්.
35. හඳුන්කූරු පැකට් 2 ක්, අනුකරණ මුදු 55 ක්.
36. රේඩියෝ කොටස් කෑලි 2 ක්.
37. රබර් බැලුන් 94 ක්.
38. මොඩ් අච්කණ්නාඩි ජෝඩු 1 ක්.
39. 'ෆාර්ගෝ' මැන්ටල් 12 ක්.
40. අඟල් 1 කපු ලේස් පැකට් 72 ක්.
41. මහතුන්ගේ පනා 625 ක් (සූට්කේසයක බහා ඇත.)
42. ෆාර්ගෝ මැන්ටල් 40 ක්, අසම්පූර්ණ "ස්පිරෝග්‍රාෆ්" කට්ටල් 13 ක් අත්සන් කිරීම සඳහා පාවිච්චි කරණ උල්පත් පෑන් තල 250 ක්, සාරි කටු (බ්‍රෝඩ්) 6 ක්, ඇස් ආලේපන බඳුන් 70 ක්, ක්‍රෝචට් ඉඳි කටු 132.
43. සෙල්ලම් මර්ලෝසු කාඩ් 5 (60), ඇස්බැම් පැන්සල් 20, අනුකරණ චේන් පැකට් 3, විවිධ කොණ්ඩා කටු කාඩ් 80 (800), පැලාස්ටික් තීන්ත පුරවනයන් 10, පබලු පැකට් 1, වළලු පෙට්ටි 84.

කපු ලේස් පැකට් 2, සාරි බෝඩර් පැකට් 2, ආගමික පදක්කම් පැකට් 1, අනුකරණ මුදු 10, 'බ්‍රේඩින්' පැකට් 1, මහතුන්ගේ පාවහන් ජෝඩු 1, අනුකරණ මුදු පැකට් 50, බොරු කොණ්ඩා 1 ක්.

44. 1" කපු ලේස් පැකට් 178 ක්.

45. අනුකරණ මුදු 270, නෝනා මහතුන්ගේ ඇතිපනා 20 ක්, පබලු වැල් පොට 11, අනුකරණ මුදු 340, කරාබු කුට්ටම් 640, (අනුකරණයක්).

46. අනුකරණ කර්ණාභරණ ජෝඩු දුසිම් 113 ක්.

47. කොණ්ඩා ඇමුණුම් කටු 225×12, අනුකරණ මුදු පැකට් 11, ප්ලාස්ටික් මල් 25, ස්වර්ණාභරණ පෙට්ටි ඇමුණුම් කටු පැකට් 5. එම අසම්පූර්ණ 1, 'අයිටච්' බඳුන් දුසිම් 1, ගොහානකටු දුසිම් 12, නරක්වූ බෝල් පොයින්ට් කූරු පැකට් 22×144, අනුකරණ චේන් කුඩා පැකට් 1 ක්.

48. අනුකරණ ස්වර්ණාභරණ පෙට්ටි 1 ක්.

49. රාත්තල් 100 ක් බරැති නයිලෝන් රෝල් 106 ක්.

50. ආරක්‍ෂා සහිත ගිලට්න් රේසර් පෙට්ටි 96×6 ක්

51. ආරක්‍ෂා සහිත ගිලට්න් රේසර් පෙට්ටි 123×6 ක්.

52. ආරක්‍ෂා සහිත ගිලට්න් රේසර් පෙට්ටි 64×6 ක්.

53. ආරක්‍ෂා සහිත ගිලට්න් රේසර් පෙට්ටි 11, 'පාවුල්ස්' fප්‍රිවිල් 11×144 ක්. බයිසිකල් සඳහා අවශ්‍ය ඩිරෝ බෝල්ට් ඇණ (ශුද්ධ බර රා. 175) 10920 ක්.

54. වෙට්‍රාල් නූල් කැරලි 1 ක්.

55. පොල් තෙල් බෝතල් 5 ක්, 'ෂාක්ස් ලජ්ජි' බෝතල් 1 ක්.

56. කුණු ගැවුණු පොප්ලින් යාර 3 ක්.

57. නයිලෝන් රෙදි කෑලි 2 ක් (යාර 3).

58. නයිලෝන් රෙදි කෑලි 1 (යාර 4).

59. ටෙට්රෝන් කමිස රෙදි යාර 16 ක්, එම යාර 19 ක්, එම යාර 22 ක්, කුණු ගෑවී ඇත. කලිසම් රෙදි 1 ක්.

60. නයිලෝන් නූල් කෝකු 4 ක්.

61. ස්පීකර් 2 ක්.

62. නරක්වූ නැෂනල් පැනසොනික් ටේප් රෙකෝඩර් 1 ක්.

63. මූණු තුවා 3 ක්, නාන තුවා 1 ක්, ස්ප්‍රේ මිස්ට් fපපසි කොලෝන් බෝතල් 1 ක්, ලුණු යොදා ඇති රටකජු අඩංගු භාජන 1 ක්.

64. රේඩියෝ වැල්ව් 1 ක්.

65. විරෝ ඉබ්බන් 2 ක්.

66. කපු සරොම් 1 ක්, (යන්තමින් කුණු ගෑවී ඇත).

67. නෝනා මහතුන්ගේ ලේන්සු 11 ක්.

68. 'ආගෝසි' සබන් කෑලි 1 ක්.

69. ටෙට්රෝන් කමිස 1 ක්.

70. $14\frac{1}{2}$ බ්‍රිතයිලෝන් කමිස (පාවිච්චි කල) 1 ක්.

71. රබර් පයිප්ප යාර 27 ක් පමණ.

72. පාස් සත ඊයම් කෑලි 8 ක්, පාවිච්චිකල රේඩියෝ වැල්ව් 1 ක්.

73. කම්බි ඇල් රෝල් 68 ක්.

74. 'මේරි ජැනට්' මංලු මරණ ඔරු 1 ක්, වීටීඑන්. 149 දරණ රූවල් බෝට්ටු 1 ක්.

75. රබර් බැලුම් 84 ක්, හිස් බෝතල් 33 ක්.

76. රතු රිබන් රෝල් 240 ක්, කැල්ටෙක්ස් ආරක්‍ෂා සහිත රේසර් (නො. 333 දරණ) 133 ක්, කළු රුන් කැරලි පැකට් 93×10, 'මර්චන්ට්' උල්පත් පෑන් 78 ක්, 'ඇන්කර්' ලකුණ—දෙපත් ස්විච් 12 ක්, 'ඇනකර්' ලකුණ තනි අත් ස්විච් 48 ක්, 'ප්ලැටෝ' බෝල්ට් පොයින්ට් කූරු 425, නෝනා මහතුන්ගේ ඇති පනා 1268, නෝනා මහතුන්ගේ පනා (මධ්‍යම) 130 ක්, 'බීවිල්' පනා 927 ක්.

77. පබලු චේන් 13 ක්, එම 2 ක්.

78. 'අලොයා' තුංමං කීලකයන් 262 ක්, එච්එල්. 413 දරණ යතුරු දෙකක් සහිත ඉබ්බන් 1 ක්, ට්‍රන්ක්පෙට්ටියක බහා ඇති නරක්වූ තීලකයන් 9 ක්.

79. 'සිස්කෝ' සෝදා ඇඳිය හැකි ළමුන්ගේ ජර්සි 60 ක්.

80. බැටරිවලින් ක්‍රියා කරන ලැන්තෑරුම් 1 ක්.

81. රබර් ෂීට් 2 ක්.

82. අංක ඒඑච්. 46806 දරණ බෙල් එකක් සහිත රැලේ බයිසිකලයක්.

83. කරාබු රාත්තල් 26 ක්, එන්සල් රාත්තල් 2 ක්.

84. පී.වී.සී. ටේප් රෝල් 20 ක්, 'කැලිපෝන්' බෝතල් 1 ක්, සිග්සැක් සිගරට් කොළ 65 ක්, "කුල්රන්" ආමෙටර් 1 ක්, ගුලා තලව් 4 ක්, තඹ ලාම්පු 1 ක්, සිරුමාරු යතුරු 11 ක්.

85. මොඩ් අව් කණ්ණාඩි 40 ක්, මොඩ් කණ්ණාඩි (නරක්වූ) 1 ක්.

86. 'ඉල් පෝඩ්' එච්පී. 4120 වර්ගයේ fපිල්ම් රෝල් 7 ක්.

87. අත්සන් කිරීමට ගන්නා උල්පත් පෑන්තල පැකට් 70×144 ක්.

88. අනුකරණ චේන් පැකැට් 1 ක්, නෝනා මහතුන්ගේ ඇතිපනා 12ක්, ප්ලාස්ටික් වලලු රෝල් 3 ක්, ඇස්බැමි පැන්සල් 12 ක්, වළලු පෙට්ටි 21 ක්, සෙල්ලම් ඔර්ලෝසු 5 ක්, රිබන් රෝල් 2 ක්. ආරක්‍ෂා සහිත රේසර් 1 ක්, පෙන්ඩෙන්ට්ස් 3 ක්, කලු රුන් කැරලි 1 ක්, ගෝගෝ කොණ්ඩා ඇල් පැකැට් 1×12 ක්, පබලු මිටි 9× කැරලි 12 ක්.

89. කම්බි ඇල් රෝල් 7 ක්.

90. ගෝනියක බහා ඇති ගම්මිරිස් රාත්තල් 1 ක්.

91. 'හකෝබා' රෙදි රෝල් 4 ක් යාර 56 ක්.

92. නයිලෝන් කමිස රෙදි යාර 1 ක්, කුණු ගැවුණු නයිලෝන් ක්‍රේප් රෙදි යාර 7 ක්.

93. වැඩ දැමූ නයිලෝන් යාර 7 ක්.

94. කුණු ගැවුනු කපු වොයිල් සාරි 2 ක්.

95. නයිලෙක්ස් සාරි 1 ක්.

96. කපු සාරි 1× මීටර් 5, ටෙට්‍රෝන් කමිස රෙදි කෑලි 2 ක්.

97. නයිලෝන් රෙදි කෑලි 9 ක් යාර 11 ක්.

98. කුණු ගැවුනු ටෙරලින් කමිස රෙදි කෑලි 1× යාර $2\frac{1}{2}$ ක්. එම 1× යාර 4 ක්, එම 1× යාර $3\frac{1}{2}$ ක්.

99. කෘතිම සිල්ක් කච්චි රෙදි යාර 4 ක්.

100. කලිසම් රෙදි කෑලි 1 ක්.

101 කුණු ගැවුනු ටෙරිවෙයාර් රෙදි යාර 5 ක්.

102. ටෙරලින් කමිස රෙදි යාර 4 ක්.

103. නයිලෝන් කච්චි රෙදි යාර 2 ක්.

104. පොප්ලින් යාර 1 ක්.

105. යූඇම් 3 වීර්/1.5වී ට්‍රාන්සිස්ටර් රේඩියෝ බැටරි පෙට්ටි 83×24, නුවරඑළිය ස්වවුට් බෝතල් 93 ක්.

6–190—73.06.08 දින අංක 63 දරණ ගැසට් පත්‍රය

---

## බඩුබාහිරාදිය විකිණීම

ආපසු ලැබුණු ලියුම් කාර්‍යාලයට, ලැබුණු හිමිකම් නොපෑ තැපැල් භාණ්ඩවල බහා තිබුණු පහත සඳහන් භාණ්ඩ 1973 ජූනි මස 14 වැනි බ්‍රහස්පතින්ද උදේ 9.30 ට කොළඹ විජේවර්ධන මාවතේ මධ්‍යම ලිපි හුවමාරු කාර්‍යාලයේ අහිමි ලිපි කාර්‍යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

සාධාරණ ගණනකට නොඉල්ලනු ලබන භාණ්ඩ විකිණීම අත්හිටවනු ලැබේ. බඩු මිළයට ගත් අය විසින් වහාම එහි වටිනාකම මුදලින් ගෙවා බඩු එදිනම ඉවත් කර ගත යුතුය.

ජේ. එච්. පී. ගුරුගේ,
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි
සංදේශ අධ්‍යක්ෂ වෙනුවට.

තැපැල් කොට්ඨාශය
තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථානය,
කොළඹ 1,
1973.05.23.

| භාණ්ඩ අංකය | | භාණ්ඩ විස්තර |
|---|---|---|
| 1 | ... | පරණ පත්තර හොණ්ඩරයක් |
| 2 | ... | එම |
| 3 | ... | එම හොණ්ඩර භාගයක් |
| 4 | ... | එකක් රාත්තල් 40ක් බර ඇති පරණ මුද්‍රිත කඩදාසි මළු 40ක් |
| 5 | ... | එම |
| 6 | ... | ඉංග්‍රීසි සඟරා 100 මිටියක් |
| 7 | ... | එම |
| 8 | ... | එම |

| භාණ්ඩ අංකය | භාණ්ඩ විස්තර |
|---|---|
| 9 ... | ඉංග්‍රීසි සඟරා 100 මිටියක් |
| 10 ... | එම |
| 11 ... | එම |
| 12 ... | එම |
| 13 ... | එම |
| 14 ... | එම |
| 15 ... | එම |
| 16 ... | එම |
| 17 ... | එම |
| 18 ... | එම |
| 19 ... | දෙමළ සඟරා 100 යේ මිටියක් |
| 20 ... | වෛද්‍ය සඟරා 100 යේ මිටියක් (ඉංග්‍රීසි) |
| 21 ... | ආගමික සඟරා 100 යේ මිටියක් (ඉංග්‍රීසි) |
| 22 ... | චීන සඟරා 100 යේ මිටියක් (ඉංග්‍රීසි) |
| 23 ... | එම |
| 24 ... | එම |
| 25 ... | එම |
| 26 ... | එම |
| 27 ... | එම |
| 28 ... | එම |
| 29 ... | එම |
| 30 ... | ඉංජිනේරු සඟරා 100 යේ මිටියක් (ඉංග්‍රීසි) |
| 31 ... | පසුගිය දෙමළ කලෛයිමගල් සඟරා 100 යේ මිටියක් |
| 32 ... | එම |
| 33 ... | කැටලෝග් පොත් තොගයක් (ඉංග්‍රීසි) |
| 34 ... | චීන ළමා පොත් 100 යේ මිටියක් (ඉංග්‍රීසි) |
| 35 ... | එම |
| 36 ... | එම |
| 37 ... | එම |
| 38 ... | එම |
| 39 ... | එම |
| 40 ... | චීන ළමා පොත් 100 යේ මිටියක් (ඉංග්‍රීසි) |
| 41 ... | එම |
| 42 ... | එම |
| 43 ... | එම |
| 44 ... | එම |
| 45 ... | එම |
| 46 ... | එම |
| 47 ... | චීන පින්තූර කාඩ් පැකට් 30 යි |
| 48 ... | පසුගිය 'රීඩර්ස් ඩයිජස්ට්' සඟරා 25 ක් |
| 49 ... | එම |
| 50 ... | එම |
| 51 ... | එම |
| 52 ... | 'ලූහුෂන්' විසින් ලියන ලද කථාන්දර පොත් 10 යි (ඉංග්‍රීසි) |
| 53 ... | එම |
| 54 ... | එම |
| 55 ... | එම |
| 56 ... | එම |
| 57 ... | චීන ප්ලාස්ටික් රෙකෝඩ් 100 ක් |
| 58 ... | එම |
| 59 ... | එම |
| 60 ... | එම |
| 61 ... | එම |
| 62 ... | පසුගිය ජාතික භූගෝල සඟරා 5 යි (ඉංග්‍රීසි) |
| 63 ... | එම |
| 64 ... | ඔස්ට්‍රේලියාව සම්බන්ධ අලංකාර පින්තූර පොතක් |
| 65 ... | මුද්දර ඇල්බම දෙකයි |
| 66 ... | භෞතික විද්‍යාව (න්‍යෂ්ටිය පිළිබඳ) රේඩියෝ ලොජි සහ රේඩියෝ බයෝ ලොජිකල් සම්බන්ධ පොත් 4 යි |
| 67 ... | සිංහල පොත් 4 යි |
| 68 ... | ඉංග්‍රීසි පොත් 4 යි |
| 69 ... | මියුසික් පොත් 39 යි |
| 70 ... | පැටන් කැටලොග් පොත් 6 යි |
| 71 ... | විසිදහක් පමණ (20,000) පාවිච්චි කළ පරණ මුද්දර තොගයක් |
| 72 ... | එම |
| 73 ... | එම |
| 74 ... | එම |
| 75 ... | එම |
| 76 ... | එම |
| 77 ... | එම |
| 78 ... | එම |
| 79 ... | එම |
| 80 ... | පිරිමි කුඩ එකක් |
| 81 ... | කාන්තා කුඩ එකක් |
| 82 ... | ෂර්ට් එකයි, ස්කාෆ් දෙකයි, කළිසන් එකයි |
| 83 ... | මේස් බැනියන් දෙකයි, සරොන් එකයි, කැන්වස් කැප් එකයි |
| 84 ... | කාන්තා 'ටයිට්ස්' කුට්ටන් එකයි, ලේන්සු 4 යි, බෙලිකටු වලින් සාදන ලද මාල එකයි |
| 85 ... | පාවිච්චි කරන ලද ඇඳුම් තොගයක් (කෑළි 11 යි) සහ ප්ලාස්ටික් කවරයක් (පළුදු) පරණ මුදල් පසුම්බි දෙකක් |
| 86 ... | උපැස් ජෝඩු දෙකක් |
| 87 ... | අව් උපැස් ජෝඩු එකක් |
| 88 ... | 1973 ඩයරි 8 යි, සෙල්ලම් බඩු එකයි (පළුදු), ගුවන් විදුලි සෑදීම පිළිබඳ ඩයග්‍රම් එකක් (තඹ) |
| 89 ... | 1973 කැලැන්ඩර් 10 යි |
| 90 ... | එම |
| 91 ... | එම |
| 92 ... | එම |
| 93 ... | 1972 කැලැන්ඩර් 5 යි |
| 94 ... | සිලික් රෙදි කෑලි දෙකක් |

(කිව/618)

6–182—73.06.08 දින අංක 63 දරණ ගැසට් පත්‍රය

---

## ප්‍රසිද්ධ වෙන්දේසිය

### ප්‍රධාන මහෙස්ත්‍රාත් උසාවිය—කොළඹ

මෙම උසාවියේ නඩු වලට ඉදිරිපත් කළ අයිතිකරුවන් විසින් ඉවත් කර ගෙන නැති භාණ්ඩ තොගයක් 1973 ජූනි මස 30 වෙනි දින පස්වරු 12.30ට උසාවි භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු බවට මහජනයාට මෙයින් දැනුම් දෙමි.

එදින දවල් 12 සිට එම භාණ්ඩ බලා ගැනීමට ඉඩ සලසනු ලැබේ. විකිණීමට නියමිත භාණ්ඩවල සම්පූර්ණ ලැයිස්තුවක් වෙන්දේසි දිනට සතියකට පෙර උසාවි දැන්වීම් පුවරුවේ පළකරනු ඇත.

ඕ. ඊ. ධර්මසේකර,
ප්‍රධාන මහෙස්ත්‍රාත්.

1973 මැයි මස 24 වන දින,
කොළඹ, ප්‍රධාන මහෙස්ත්‍රාත් උසාවියේ දීය.

6–198—73.06.08 දින අංක 63 දරණ ගැසට් ප

# විවිධ දැන්වීම්

## රාජ්‍ය චිත්‍රපට සංස්ථාව

### සැපයුම් කරුවන් ලියාපදිංචි කිරීම

1973 ජූලි මස 1 වෙනිදා සිට දෙසැම්බර් මස 31 වෙනිදා අතර කාල සීමාව තුළ, මතු දැක්වෙන විෂයන් මෙම කාර්යාලයට සැපයීම සඳහා දේශීය සැපයුම් කරුවන් මෙම සංස්ථාවේ ලියාපදිංචි කරනු ලැබේ.

1. විදුලි උපකරණ සැපයීම් හා වැඩ.
2. ලෝහ භාණ්ඩ සැපයීම්.
3. ලිපි ද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතාවන්.
4. වර්ණ 2 හා 3 පෝස්ටර් මුද්‍රණය (ඡායාරූප) ප්‍රමාණයන් සඳහන් කරන්න.
5. දැන්වීම් පත්‍රිකා හා පෝස්ටර් (අකුරු) මුද්‍රණය, ප්‍රමාණයන් සඳහන් කරන්න.
6. චිත්‍ර සැළසුම් සකස් කිරීම.
7. චිත්‍රපට ප්‍රචාරක පුවරු හා රෙදි පුවරු ඇඳීම.
8. සිල්ක් ස්ක්‍රීන් පෝස්ටර් මුද්‍රණය.
9. සිනමාශාලා ප්‍රවේශපත්‍ර හා දෛනික වාර්තා මුද්‍රණය.
10. විදුලි උපකරණ අළුත්වැඩියා කිරීම.
11. වාහන අළුත්වැඩියා කිරීම.

2. මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල ඉහත දැක්වූ එක් එක් ශීර්ෂයන් යටතේ එන කරුණු පිළිබඳ විස්තර සඳහන් කොට 1973 ජූනි මස 29 වෙනි දිනට හෝ ඊට පෙර මෙම කාර්යාලයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් රාජ්‍ය චිත්‍රපට සංස්ථාවේ සාමාන්‍යාධිකාරි නමට එවිය යුතුය.

3. 1973. 04. 12 සහ 26 දිනැති පුවත්පත් දැන්වීම් අනුව පිළිතුරු එවූ අය නැවත ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කිරීම අනවශ්‍ය වේ.

සාමාන්‍යාධිකාරී.

රාජ්‍ය චිත්‍රපට සංස්ථාව,
224, බෞද්ධාලෝක මාවත,
කොළඹ 7.
1973. 05. 26.

6–280—73.06.08 දින අංක 63 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|
| මැයි | 73.05.04 | සිකුරාද | ... | 73.04.25 | බදාද | දවල් | 12.00 |
| | 73.05.11 | සිකුරාද | ... | 73.05.02 | බදාද | දවල් | 12.00 |
| | 73.05.18 | සිකුරාද | ... | 73.05.09 | බදාද | දවල් | 12.00 |
| | 73.05.25 | සිකුරාද | ... | 73.05.15 | අඟහරුවාද | දවල් | 12.00 |
| ජූනි | 73.06.01 | සිකුරාද | ... | 73.05.23 | බදාද | දවල් | 12.00 |
| | 73.06.08 | සිකුරාද | ... | 73.05.30 | බදාද | දවල් | 12.00 |
| | 73.06.14 | බ්‍රහස්පතින්ද | ... | 73.06.06 | බදාද | දවල් | 12.00 |
| | 73.06.22 | සිකුරාද | ... | 73.06.13 | බදාද | දවල් | 12.00 |
| | 73.06.29 | සිකුරාද | ... | 73.06.20 | බදාද | දවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.